2014 අප්‍රේල් 06 ඉරිදා

ලක්බිම

# රිද්ම

Ridma


Signal

දත් කුහරවලින් සුපිරි ආරක්ෂාවකට




රු. 20/- සිට ඉහළට

දත් කුහර වලක්වන ආරක්ෂක ආවරණය සමග



# කරීනා කපූර්ගේ රංගනයන් අවසන් වන ලකුණු!



කරීනා කපූර් අපූරු රංගනයක් ඉදිරිපත් කළ හිරෝයින් චිත්‍රපටයේ ඇය රඟපාන්නේ කලක් සිනමාවේ ඉහළම තලයේ වැජඹී ඉන්පසු අසාර්ථක වන නිළියකගේ චරිතයයි. ඇගේ සිනමා ජීවිතයේ හොඳම රඟපෑම මාහි අරෝරා නම් මේ චරිතය බව විචාරක පිළිගැනීමයි. කොහොමවුණත් මේ චරිතය ඇයට සැබෑ ජීවිතයේත් රඟපාන්නට සිදුවී ඇති බවට පුවතක් වාර්තා වෙනවා. ඒ විවාහයෙන් පසු හා එකදිගට ඇය පසුගිය කාලයේ රඟපෑ චිත්‍රපට අසාර්ථක වීමෙන් පසු ක්‍රමයෙන් කරීනාගේ බහින කලාව ළඟාවී ඇති බවයි. මේ නිසාම චිත්‍රපට අධ්‍යක්ෂවරුන්ට දුරකථන ඇමතුම් දෙමින් ඔවුන්ගෙන් චිත්‍රපටවල රඟපෑමට අවස්ථාවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින තැනට ඇය පත්ව සිටිනවාලු.

පසුගිය දිනයක සුප්‍රකට චිත්‍රපට අධ්‍යක්ෂ හා නිෂ්පාදක සංජේ ලීලා බන්සාලිට දුරකථන ඇමතුමක් දුන් කරීනා ඔහුගේ අලුත්ම චිත්‍රපටය වන බජිරාඕ මස්තානි චිත්‍රපටයේ ප්‍රධාන චරිතය තමාට ලබාදෙන ලෙස ඇවිටිලි කොට තිබෙනවා. සංජේ එය ප්‍රතික්ෂේප කොට කියා ඇත්තේ තමා දැනටමත් ඒ චරිතයට දීපිකා පදුකෝන් තෝරාගෙන ඇති බවයි. කරීනා දිගින් දිගටම ඇවිටිලි කරද්දී චිත්‍රපටයේ උප ප්‍රධාන චරිතය ලබාදීමට තමා උත්සාහ ගන්නා බවට සංජේ ඇයට පොරොන්දු වුණත් ඒ වනවිටත් එම චරිතයට මනු ප්‍රියංකා චොප්රාව තෝරාගෙන අවසන්ව සිටි බවත් වාර්තා වෙනවා.

පසුගිය කාලයේ බොලිවුඩයේ වැඩිම ගෙවීමක් ලබන ඉහළම පෙළේ නිළියක් ලෙස නමක් දිනා සිටි කරීනා කපූර් මෙවැනි තත්ත්වයකට පත්වන්නට හේතුව සෙයිෆ් අලි ඛාන් සමග ඇගේ විවාහය හෝ තවදුරටත් ඇය යොවුන් නිළියක් නොවීමට වඩා ඇගේ චිත්‍රපට පසුගිය කාලයේ එකදිගටම අසාර්ථකවීම බවයි කතුදත් අය කියන්නේ. මේ නිසා පසුගිය කාලයේ ඇයව තෝරාගෙන තිබුණු දැවැන්ත නිෂ්පාදන කිහිපයෙන්ම ඇයව ඉවත්කරන්නට අධ්‍යක්ෂකවරු පියවර ගත්තා. සංජේ ලීලා බන්සාලි වුණත් මුලින්ම බජිරාඕ මස්තානි චිත්‍රපටයේ ප්‍රධාන චරිතයට ගැනීමට තීරණය කොට තිබුණේ ඇයවයි. කරන් ජොහාර් ගේ ශුද්ධි චිත්‍රපටයෙන් වගේම බොලිවුඩ් සමුරායි චිත්‍රපටයෙනුත් ඇයව ඉවත් කෙරුණා.

මේ අතර කවුරු කොහොම කිව්වත් දකුණු ඉන්දියානු සිනමාවේ මෙන් නොව බොලිවුඩය තුළ විවාහක නිළියන්ට ඉහළම තලයේ වැජඹෙන්නට අපහසු බව නොරහසක්. විවාහයෙන් පසු අයිෂ්වර්යා රායි හා කාජල් වැනි නිළියන්ට වුණත් ඇති ඉල්ලුම අඩුවූ අතර කරීනාගේ සොයුරිය කරිෂ්මා වුණත් සිනමාවේ දෙවන ගමනක් අරඹන්නට විවාහයෙන් පසු උත්සාහ කළත් එය සාර්ථක වුණේ නැහැ. කරීනාගේ වයස දැන් අවුරුදු තිස්තුනක් වුණත් තවමත් තම සිරුර සිහින්ව හා රූමත්ව තබාගන්නට ඇයට හැකිවී තිබෙනවා. නමුත් හිතවත්කම්වලට වඩා ලාභ පාඩු බලන කර්මාන්තයක් තුළ චිත්‍රපට සාර්ථක නොවී නිළියකට පවතින්න අසීරුයි.

පසුගිය කාලයේ කරීනා රඟපෑ ඒජන්ට් විනෝද්, සත්‍යාග්‍රහ හා ගෝරි තෙරේ ප්‍යාර් මේ යන චිත්‍රපට සියල්ලම ආදායම් ලැබීම අතින් අසාර්ථක වුණා පමණක් නෙමෙයි ඇගේ රඟපෑම් පවා විචාරක අගැයීමට ලක්වුණේ නැහැ. දැනට ඇය රඟපාන්නේ හැපි එන්ඩින් චිත්‍රපටයේ ආරාධිත චරිතයක් හා සිංගම් 2 චිත්‍රපටයේ පමණයි. සිංගම් 2 අසාර්ථක වුණොත් කරීනා කපූර්ගේ සිනමා ගමනට තිතක් වැටීම සිකුරු බවයි විචාරක අදහස වී ඇත්තේ .

■ නිශානි දිසානායක



# දූවගේ මූණ දැක්කම ඇති වූ හැඟීම් විස්තර කරන්න වචන නැහැ

## මව් පදවිය ලද වත්සලා සමග කතාබහක්



ජනප්‍රිය ටෙලිනාට්‍ය නිළි වත්සලා දියලගොඩ මව් පදවිය ලබන්නට සූදානම් වන පුවත මීට මාස කිහිපයකට කලින් අපි අපේ "රිද්ම" පාඨක හිතවතුන්ට දැනුම් දුන්නා. මව් පදවියට සැරසුණු වත්සලා ඒ වෙනුවෙන් පසුගිය මාස කිහිපය තුළ රංගනයෙන් තාවකාලිකව සමු අරං නිවසට වෙලා විවේකී සුවයෙන් පසුවුණා. නමුත් වත්සලාට ආදරය කරන ඇගේ ආදරණීය රසික රසිකාවියන් නම් නිරන්තරව වත්සලා ගැන අවධානයෙන් පසුවුණා.

"වත්සලාට මව් පදවිය ලැබෙන්නේ කවදාද? වත්සලාට මව් පදවිය හිමිවුණාද? එයා ආයෙම රංගනයට එනවාද?"

ඔන්න ඔය වගේ ප්‍රශ්න වත්සලාගේ රසිකයින් තුළ නැගුණා. ඇතැම් අය අප වෙතින් පවා ඒ ගැන විමසුවා. වත්සලා ගැන විමසිල්ලෙන් පසුවූ ඇගේ ආදරණීය රසික රසිකාවියන්ට මේ සතියේ අපි වත්සලා ගැන සුබ ආරංචියක් අර ගෙන එනවා. ඒ ඇය පසුගියදා මව් පදවිය ලැබූ ආරංචිය.

පසුගිය මාර්තු 23 වැනිදා රාත්‍රියේ වත්සලා පුංචි දියණියක් බිහිකළා. ආරංචිය ලැබූ සැනින් ඒ ගැන අපි විමසුවා. ඒ වන විටත් වත්සලා මඳක් විවේකී සුවයෙන් පසුවූ හින්දා අපිත් එක්ක කතාබහට එකතු වුණේ වත්සලාගේ ආදරණීය සැමියා ප්‍රසංග ගුණසිංහ.

"23 වැනිදා ඒ. ලංකා හොස්පිටල් එකේදී දුව ඉපැදුනා... හරි සතුටුයි..." හැමදාමත් මාධ්‍ය සාකච්ඡාවලදී කෙටි පිළිතුරු දෙන ප්‍රසංග ඒ විදිහට කියලා හිනාවුණා. නමුත් පිය පදවිය ලැබීම නිසා ප්‍රසංගගේ සිතේ උතුරන සතුට නම් මහ විශාල එකක්.

■ **දුව කවුරු වගේද?**

ගොඩක් සුදුයි. මට නම් කවුරු වගේද කියල කියන්න බැහැ. ඒත් බලන්න එන අය නම් කියන්නේ වත්සලා වගේ කියලා.

■ **බලාපොරොත්තුවෙන් හිටියෙ දුවෙක්ද?**

ස්කෑන් පරීක්ෂණ මගින් අපි දැනගෙන හිටියා ලැබෙන්නේ දුවෙක් බව. ඊට කලින් දරුවා ලැබෙන ආරංචිය ලැබූ මොහොතේ ඉඳන් මම නම් ආශාවෙන් හිටියේ දුවෙකුට තමයි.

විවේකී සුවයෙන් පසුවන වත්සලාවත් අපිත් එක්ක සම්බන්ධ කරන්න ප්‍රසංග උදව් කළා. විධාපත් බවකට වඩා වත්සලා තුළින් මතුවී පෙනෙන්නේ උතුරා යන සතුටක්. කුළුඳුලේම මව් පදවිය ලැබීමේ අපූරු අත්දැකීම, ඒ මොහොතේ හිතට දැනුණු හැඟීම් අපි වත්සලාගෙන් විමසුවා.

"....දරුවා ඉපදෙන අවස්ථාවේ ප්‍රසංගත් මා ළඟින්ම හිටියා. ඒක මගෙ හිතට ලොකු ශක්තියක් වුණා. ඩොක්ටර් විජිත් විද්‍යාභූෂණ තමයි සැත්කම සිදුකළේ. ඒ අවස්ථාවේ මම පියවි සිහිය තුළ හිටියා. සිතේ බය නැති කරලා අපි දෙන්නාත් එක්ක සුහදව කතාබහ කරමින් ඩොක්ටර් ඒ අවස්ථාව සාමාන්‍ය මොහොතක් බවට පත්කළා. හා හා පුරා දුවගේ මුහුණ දකින විට දැනුන හැඟීම් විස්තර කරන්න නම් වචන නැහැ..."

වත්සලාගේ පුංචි දියණියට තවමත් නමක් යොදලා නැහැ. දැරියගේ උපන් වේලාව අනුව සුදුසු අක්ෂර බලලා ඊට ගැළපෙන නමක් යොදන නිසා දියණියගේ නම් තැබීම ඉදිරියේදී සිදු කරන බව තමයි වත්සලා පවසන්නේ.

වත්සලා දියලගොඩ රටම හඳුනා ගත්තේ නිළියක් විදියට. දරුවා ලැබෙන්නට තාවකාලිකව රංගනයෙන් සමුගත් ඇයට දැන් ඉතින් දියණිය ඉපැදුණු පසුව කරන්නට රාජකාරි බහුලයි. වත්සලාගේත් ප්‍රසංගගේත් මව්වරු මේ වෙද්දිත් මේ අයගෙ නිවසට එකතු වෙලා ඉන්නේ පුංචි මිණිපිරියගේ කටයුතු කරන්න. ඒත් ඉතින් මවටත් තම සිඟිත්තියගේ කටයුතු වෙනුවෙන් යොදන්න වන කාලය වැඩියි. ඇතැම් නිළියන් ගායිකාවන් වැනි ජනප්‍රිය චරිත මව් පදවිය සමගම කලාවෙන් දුරස් වුණ අවස්ථා තියෙනවා. දරුවන් නිසා රැකියාවෙන් ඉවත්වන සාමාන්‍ය කාන්තාවනුත් ඉන්නවා. දියණිය වෙනුවෙන් වත්සලාත් රංගනයෙන් දුරස් වේවිද කියලා අපි විමසුවා.

"තාවකාලිකව දුරස් වෙනවා. ඒත් ඉදිරියේදී ආයෙම රඟපෑමට එකතු වෙනවා.." වත්සලා පැවසුවා.



■ ආරියවංශ කුලතිලක



# ඔබ සතු බොහෝ උපකරණ චාජ් කළ හැකි බලගතු "පවර් පෙන්" එකක්

අද කාලයේ විධායක නිලධාරියෙකුට උදේ රැකියාව සඳහා යාමට එළියට බහින්න කලින් කරදර වෙන්න බොහෝ දේ තිබෙනවා. ඇඳුම හොඳද? ලැප්ටොප් ස්මාට් ෆෝන් චාජ් කරලද මේ වගේ නොයෙකුත් ගැටලු රැසක් ඔළුව ඇතුළෙ තියාගෙන තමයි උදේට වැඩට යන්න ලෑස්ති වෙන්නේ. මේ ගැටලුවලින් සමහර ඒවාට විසඳුම් සපයා දෙන අපූරු උපකරණයක් දැන් වෙළෙඳපොළට නිකුත් වෙලා. "ද පවර් පෙන්" නමින් හැඳින්වෙන මෙය ඔබේ බොහෝ උපකරණ චාජ් කිරීමේ හැකියාව සඳහා ඕනෑම තැනක ගෙන යා හැකි චාජර් එකක්. ඔබ කළ යුතු වන්නේ මේ චාජරයද සමග ලැබෙන බහු විධ ඇඩප්ටරයද ඔබේ උපකරණයට සවි කිරීම පමණයි. මෙම චාජරය USB කේබලයක් මගින් විදුලි බලය ආධාරයෙන් චාජ් කොට බොහෝ වෙලා භාවිතා කළ හැකිය.






# අනුන්ට නැතුව තමන්ට විතරක් සින්දු ඇහෙන කොට්ටයක්

පුංචි කාලෙ අපිට නින්ද යන තුරු අම්මලා නැලවිලි ගී කිව්වට ලොකු මහත් වුණාට පස්සෙ එහෙම කරන්නෙ නෑ. ඒත් හිතට අස්වැසිල්ලක් නැතුව රෑ නින්දට යද්දී මේ කාලෙ තමයි ඒ වගෙ නැලවිලි ගී ඇහෙන්න ඕනෙ. මේකට විසඳුමක් හැටියට දැන් අලුතින් හිත අස්වසාලන මිහිරි සංගීතය නිකුත් කරන නව තාක්ෂණයේ කොට්ටයක් හඳුන්වා දී තිබෙනවා. ඩ්‍රීම් පැඩ් නමින් හඳුන්වන මෙහි විශේෂත්වය වන්නේ ඉන් නිකුත්වෙන සංගීතය එහි හිස තියෙන පුද්ගලයාට පමණක් ඇසීමයි.

ඉන්ට්‍රාසවුන්ඩ් තාක්ෂණයේ පරානායකයන් (transducers) වලින් සමන්විත ස්පීකරයකින් බාහිරව මෙය සංගීතය ශ්‍රවණය කිරීමට සලස්වනු වෙනුවට අස්ථි සන්නයනයන් භාවිතා කරමින් සංගීතය හිස තුළට කා වද්දනු ලබනවා. මෙම ඩ්‍රීම් පැඩ් එකට ඔබට MP3 වාදක යන්ත්‍රයක් ජැක් එකක් මගින් සවි කළ හැකි නිසා ඔබ කැමති ඕනෑම සංගීතයක් රස විඳීමේ අවස්ථාව ඔබට සැලසෙනවා. මයික්‍රොෆයිබර් වලින් නිමවා ඇති මෙය සෝදා පවිත්‍ර කිරීමේ හැකියාවෙන්ද යුක්තයි.

# එකවර බොහෝ උපකරණ ක්‍රියාත්මක කළ හැකි කී බෝඩ් එකක්

ඔබ කන්තෝරුවේ වැඩක යෙදී සිටින විට පරිගණකයේ අකුරු කරන්නයි. ස්මාට් ෆෝන් එකෙන් හෝ ටැබ් එකෙන් ඊ මේල් යවන්නයි වෙන වෙනම කී බෝඩ් භාවිතා කිරීමට සිදුවීම සාමාන්‍ය දෙයක්. මේ වගේ උපකරණ කිපයක්ම එකවර යතුරු කළ හැකි අපූරු කී බෝඩ් එකක් දැන් හඳුන්වා දී තිබෙනවා.

"කානෙක්ස් මල්ටි සින්ක් කී බෝඩ්" යනුවෙන් හඳුන්වන මෙම කී බෝඩ් එකෙන් ඔබට පරිගණකය ස්මාට් ෆෝනය මෙන්ම ටැබ් එකද එක ලෙස භාවිතා කළ හැකියි. ඔබ කළ යුත්තේ එක බොත්තමක් එබීම මගින් එක් උපකරණයකින් අනෙක් උපකරණයට මාරු වීම පමණයි. දැනට ඇපල් උපකරණ සමග පමණක් භාවිතා කිරීමේ හැකියාව සහිත මෙම කී බෝඩ් එක AAA බැටරි 3කින් ක්‍රියාත්මක කළ හැකියි. මෙම කී බෝඩ් එක සමග ටැබ් හා ස්මාට් ෆෝන් රැඳවීම සඳහා රඳවනයක්ද ලැබෙන අතර මිල කොට ඇත්තේ ඇමෙරිකානු ඩොලර් 70කටයි.



■ ගැමුණු රත්නායක

# තවමත් මම අලුත් ජීවිතයට හුරුවෙනවා

## තරුෂි පෙරේරා

ජනප්‍රිය නිළි තරුෂි පෙරේරා මීට මාස කිහිපයකට කලින් පතිකුලයට ගියා. බිරිඳක් විදියට. අලුත් නිවසක අලුත් ජීවිතයක් ගත කරන තරුෂිට පහුගිය දාක අපි කතා කළා. අම්මයි තාත්තයි නංගිලයි මල්ලියි එක්ක අවුරුදු ගණන් ගත කළ ජීවිතය වෙනස් වෙලා දැන් ජීවිතයට අලුතින්ම එකතු වූ පිරිසක් සමග ගෙවන ජීවිතයේ තතු අපි විමසුවා. එදා ප්‍රේමවන්තයා අද සැමියෙකු විදියට ජීවිතය බෙදා හදා ගන්න හැටි, කලා දිවිය ගැන තොරතුරු මේ හැමදේම අපි තරුෂි සමග කතා කළා.

■ ඉතින් කොහොමද තරුෂි?

සතුටින් ජීවිතය ගෙවී යනවා.

■ අලුත් ජීවිතය ගැන මොනවාද හිතෙන්නෙ?

හරිම සුන්දරයි. ඒත් මට හිතෙන්නෙ මම තවම මේ ජීවිතයට හුරුවෙමින් පවතිනවා කියලා.

■ ඇයි ඒ?

පුංචි කාලේ ඉඳන් හැදුනේ වැඩුනේ අම්මලා තාත්තලා නංගිලා මල්ලිලා එක්ක. දැන් මගෙ ගෙදර වෙලා තියෙන්නෙ අලුත්ම තැනක්. එතැන මාත් එක්ක ඉන්නේ අලුත්ම පිරිසක්. ඉතින් ඒ ගත කරන ජීවිතයත් මට අලුත්නේ. ඒකයි මම ඒකට තවම හුරුවෙමින් පවතිනවා කියලා කිවුවේ.

■ අලුත් නිවහනේ තරුෂිගේ නෑදෑ පිරිස ගැන කතා කලොත්?

මමයි මගෙ සැමියයි සැමියගෙ දෙමවුපියන් හා වැඩිමල් සහෝදරයා තමයි මේ ගෙදර ඉන්නේ.

■ කාර්යබහුල බව අඩු නිසා ගෙදර ගත කරන කාලය වැඩියි. නැන්දම්මා එක්ක එකතුවෙලා ගේ දොර කටයුතුවල යෙදෙනවද?

උයන පිහන කටයුතු සම්පූර්ණයෙන්ම වගෙ කරන්නෙ අම්මගෙ අතින්. මම උදේට සැමියගෙ කෑම එක ලෑස්ති කරලා දෙනවා. අපේ ගෙදර තියෙන්නෙ සැමියගෙ ගෙදරට ගොඩක් දුරින් නෙමෙයි. ඒ හින්දා විවේක වෙලාවට ගෙදර ගිහින් අම්මලා බලල එනවා. ඔය අතර කලක් ඉඳන්ම මගෙන් රූපලාවන්‍ය කටයුතු කරගන්න පැමිණි පිරිසක් හිටියා. ඒ අය වගේම මගෙන් රූපලාවන්‍ය කටයුතු කරගන්න අපේ ගෙදරට එන අය ඉන්නවා. ගෙදර ගිහින් ඒ කටයුතුත් කරල අම්මලත් බලල එන්න මට දැන් විවේකය තියෙනවා.

■ ඒ විවේකය ලැබුණේ රූපලාවන්‍යාගාරයත් නතර කරලා නිසාද?

ඒකත් හේතුවක්. මම පහුගිය කාලේ විවාහය ළං වන විට ඉතුරුවෙලා තිබුණු ටෙලි නාට්‍ය කටයුතු ඉවර කළා. ඒ වගේම විවාහයට සූදානම් වුණා. ඒ කටයුතු එක්ක මම ගොඩක් කාර්යබහුල වුණා. විවාහයෙන් පස්සේ මට ඕන වුණේ මාස කිහිපයක් නිදහසේ ඉන්න. අපි දෙන්නා පිටරටකට යන්නත් සැලසුම් කරගෙන හිටියා. ඔය ඔක්කොම දේවල් හින්දයි මගෙ රූපලාවන්‍යාගාරය වෙනත් කෙනෙකුට අලෙවි කළේ.

■ අනාගතයේදී නැවත ඔබගෙ රූපලාවන්‍යාගාරයක් විවෘත කරනවද?

අනිවාර්යයෙන්ම එය සිදුවෙනවා. මගේම තැනක මගේ රූපලාවන්‍යාගාරයක් අරඹනවා. දැනටත් මම ඒ කටයුතුවලින් මිදිලා නැහැ. මගෙ ගෙදරට ඇවිත් මගෙ සේවය ලබාගන්නා අය ඉන්නවා.

■ විවාහයත් සමග තරුෂි රඟපෑමෙන් සමුගන්නා කියලා ඇතැම් අය හිතුවා.

විවාහයෙන් පසුව ලැබුණු ආරාධනා ප්‍රතික්ෂේප කළ හින්දයි ගොඩක් අය හිතුවෙ මම රඟපෑමෙන් සමුගත් බව. ඒත් මම රඟපෑමෙන් සමුගත්තෙ නැහැ. මේ වන විටත් ලක්ෂ්මන් පුෂ්පකුමාරගේ "හඳපානගල" රූගත කිරීම්වලට එකතුවනවා. එහි කොටස් 25ක් විතර කරලා තිබුණේ.

ඉතිරි දර්ශන තමයි මේ දවස්වල කරන්නේ. විවාහ වූ පසු අලුත් නිර්මාණ තවම භාරගත්තේ නැහැ.

■ ඇයි ඒ?

මම කලිනුත් කියලනේ තිබුණේ මාස කීපයක් යනතුරු අලුත් නිර්මාණ භාරගන්නේ නැති බව. ඒ හින්දයි ලැබුණු නිර්මාණ ප්‍රතික්ෂේප කළේ. හැබැයි දැන්නම් අලුත් නිර්මාණ භාර ගන්නවා.

■ සැමියගේ විරෝධතා නැද්ද?

නැහැ. මම කොහොමත් රඟපෑවේ තෝරා බේරාගත් චරිත. අනෙක මම රඟපෑ චරිත මිනිසුන්ගේ ආදරය ගෞරවය ලබන චරිත. ඉදිරියටත් ඒ තත්ත්වය ඒ වගේමයි. ඒ නිසා සැමියගෙන් විරුද්ධත්වයක් නැහැ.

■ අද සැමියා වෙලා ළඟ සිටින එදා ප්‍රේමවන්තයා ගැන මොකද හිතෙන්නෙ?

එදා වගේම තමයි. හැබැයි ඉතින් ඉස්සර නම් හරිම සැහැල්ලුවෙන් හිටියේ. දැන්නම් ටිකක් වගකීම් සහගත වෙලා.

■ දෙදෙනා අතර පුංචි පුංචි අමනාපකම් ඇතිවන්නෙම නැද්ද?

මාව අවුස්සලා කේන්ති කරන්න එයා හරි කැමතියි. හැබැයි දැන් මම ඒකට හුරුවෙලා. ඒ නිසා කේන්ති යන්නෙ නැහැ.


■ ඔයාව මොනවා කරලද කේන්ති ගස්සන්නේ?

(හිනා) මම මොනවා හරි කියන කොට ඒක ගණන් ගන්නේ නැතුව ඉන්නවා. සමහර වෙලාවට ඒකට විරුද්ධව වචනයක් කියනවා. ඒ වෙලාවට මට කේන්ති ගියාම ළඟට ඇවිත් කියනවා එහෙම කළේ මාව අවුස්සන්න කියලා.

■ ආරියවංශ කුලතිලක







# උසස් පෙළ විභාගය සඳහා සූදානම් වන ඔබට

# කෙටි සටහන් සාදාගන්නා නිවැරදි ක්‍රමය

ගියවර ලිපියෙන් අප විභාගය සහ මානසික පීඩනය පිළිබඳ කථා කළා. මෙවර ලිපියෙන් අප පැහැදිලි කරන්න යන්නේ විභාගයට සූදානම් වන ඔබ කෙටි සටහනක් සාදාගන්නේ කෙසේද යන්නයි. ඇත්තටම කෙටි සටහන් භාවිත කිරීමත් විභාගය නිසා ඇතිවන මානසික පීඩනය අවම කරගැනීමට උදවු වන ක්‍රමවේදයක්. විශාල පොත්පත් රාශියක් මේසය මත තිබෙනවාට වඩා ක්‍රමවත් ලෙස සාදාගත් කෙටි සටහන් තබාගැනීම මානසික සැහැල්ලු බව ගෙන දෙන්නක්. එනිසා විභාගයට මාස හතරක් හෝ පහක් තිබී කෙටි සටහන් සාදාගෙන තිබීම වැදගත්. අවම වශයෙන් මාස දෙකකට පෙරවත් කෙටි සටහන් සාදාගත හැකි නම් එය විභාගයේදී ඔබට විශාල උදව්වක් වනවා.

### නිවැරදිව කෙටි සටහන් සාදා ගන්නා ක්‍රමවේදය

ඔබ ක්‍රමවත් කෙටි සටහනක් සාදා ගැනීමට නම් ඔබ සතුව ක්‍රමවත් ප්‍රධාන සටහනක් තියෙන්න ඕන. ක්‍රමවත් ප්‍රධාන සටහනක් යනු අදාළ විෂය ආශ්‍රිතව ඔබ පාසලේදී හෝ උපකාරක පන්තියේදී ලියාගත් සටහනයි. මන්ද ඔබගේ කෙටි සටහනට පාදම වෙන්නේ මෙකී ප්‍රධාන සටහනයි. එනිසා ඔබගේ ප්‍රධාන සටහන සියලූ විෂය කරුණු සහිතව ක්‍රමවත්ව තිබිය යුතු අතර එහි ඇති මගහැරුණු විෂය කරුණු යහළුවකුගෙන් හෝ බලා සම්පූර්ණ කරගත යුතුයි.

මේ කරුණ මවිසින් මුලින්ම සඳහන් කරන්න යෙදුණේ එහි මනෝවිද්‍යාත්මක පසුබිමක්ද තිබෙන හෙයිනි. මන්ද අපගේ මනස මොනම අවස්ථාවකවත් අපිළිවෙළ සහිත දෙයක් පිළිගන්න සූදානම් නෑ. එනිසා ඔබගේ ප්‍රධාන සටහනත් මා මුලින් කියූ පරිදි පිළිවෙළට ක්‍රමවත්ව පැහැදිලි අත් අකුරින් තිබීම වැදගත්. එසේ වීමේදී එය ඔබට කෙටි සටහන් සාදාගැනීමට පහසු වෙනවා. එසේ නොමැතිව ඔබගේ ප්‍රධාන සටහන කරුණු මගහැරී අපැහැදිලිභාවයකින් සහ අක්‍රමවත් බවින් යුක්ත නම් ඉන් ඔබට සාර්ථක කෙටි සටහනක් සාදාගන්න බෑ. දැන් අපි බලමු කෙටි සටහන සාදාගැනීමේ ක්‍රමවේදය, මෙහිදී ඔබ විසින් පියවර හතරක් අනුගමනය කළ යුතුයි. ඉන් පළමු පියවර තුන වෙන්නේ ප්‍රධාන සටහන කියවීමයි. එයත් ක්‍රම විධි තුනක් ඔස්සේ කළ යුතුයි.

### පළමු කියවීම

ඔබගේ ප්‍රධාන සටහන ඉතා සැහැල්ලූ මනසකින් යුක්තව පළ මුවර කියවාගෙන යා යුතුයි. උදාහරණයක් ලෙස අප එදිනෙදා පුවත්පතක් කියවන ආකාරයට නිදහස් මනසින් කියවිය යුතුයි.

### දෙවන වර කියවීම

දෙවනවර කියවීමේදී පෙරට වඩා ඕනකමින් සහ අවධානයෙන් කියවිය යුතු අතර වැදගත් කරුණු විවිධ පාටවලින් යුත් පෑනකින් ඉස්මතු කර දැක්වෙන පරිදි ඉරි ඇඳ ගැනීමට පුළුවන. එහිදී නිර්වචන, වැදගත් කරුණු, ඉතාම වැදගත් කරුණු යනාදී වශයෙන් වෙන්කරගෙන පෑනෙන් සලකුණු යෙදීම කළහැක. නමුත් සටහන පිරෙන්න වර්ණ යෙදීම නොකළ යුතුයි.

### තෙවනවර කියවීම

පෙරදී අවධානයට ලක්නොවූ කරුණු ඇත්නම් එකී කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් වඩාත් හොඳින් කියවිය යුතු අතර මගහැරුණු කරුණු සටහන් කරගැනීම තෙවනවර කියවීමේදී කළ හැක.



කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන මනෝ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී මනෝ විද්‍යා ආචාර්ය **සමුද්‍රා සෙනරත්**

### සටහන සාදා ගැනීම

සිව්වැනි පියවරේදී ඔබ විසින් වර්ණ යොදා සටහන් කෙටි සටහනට ගැනීම කළ යුතු වේ.

### කෙටි සටහනේ සැකැස්ම

බොහෝ අධ්‍යාපනඥයින්ගේ මතය වනුයේ කෙටි සටහනක් කුඩා තීරුවක ඉතා කුඩා ආකාරයෙන් ලිවීම ඵලදායී බවයි. ඒ අනුව කෙටි සටහනක් සඳහා A4 කොළ යක් දෙකට නවා සාදාගත් ප්‍රමාණය (14.5 cm x 21 cm) වඩාත් සුදුසු වේ. ඉන්පසු එකී ඉඩ ප්‍රමාණය තුළ ද අඟල් 1/2ය බැගින් සතර පැත්තෙන්ම ඉඩ තබා කෙටි සටහන ලියා ගත යුතුවේ. මෙසේ සතර පැත්තෙන්ම ඉඩ තබාගනුයේ මනසට එය කියවීමේ පහසුව සඳහා වේ. ඉන්පසු ප්‍රධාන මාතෘකා නිර්වචන වැදගත් කරුණු පිළිවෙළින් පහළට ලියාගෙන යා යුතු වේ. එහිදී කරුණු දෙකක් අතරද පරතරයක් සහිතව ලිවිය යුතු අතර නිර්වචන වඩාත් වැදගත් කරුණු යනාදිය සඳහා විවිධ වර්ණ භාවිතා කළ හැක. එමෙන්ම ඔබගේ ප්‍රධාන සටහනෙන් උපුටාගත් කරුණුවලට අතිරේකව වෙනත් පතපොතින් උපුටාගත් කරුණුද කෙටි සටහනට ඇතුළත් කරන්න ඔබට පුළුවන්.

### කෙටි සටහන් සාදාගැනීමේ ප්‍රයෝජන

කෙටි සටහනක් සාදාගැනීමේ ප්‍රයෝජන රාශියක් තියෙනවා. පළ මුවැන්න තමයි පාඩම් කිරීමේ පහසුව. විශාල ප්‍රමාණයේ සටහනක් කියවනවාට වඩා කෙටි සටහනක් බලාගැනීම පහසුයි. ඒවගේම විශාල සටහනක් කියවීමට පැය භාගයක් ගතවනවා නම් කෙටි සටහනත් විනාඩි තුන හතරකින් කියවා නිම කරන්න පුළුවන්.

මතක තබාගැනීමේදී කෙටි සටහන් ඉතා ඉක්මණින් මතකයට නගා ගන්න පුළුවන්. ඒ වගේ වැඩි විෂය කරුණු ප්‍රමාණයක් ඉක්මනින් ආවරණය කරගැනීමේ හැකියාව කෙටි සටහන නිසා ලැබෙනවා.

අනෙක් අතට විභාගය ආසන්නයේදී මනසට දැනෙන පීඩනය අඩුකරගැනීමේ එක් මාර්ගයක් ලෙසත් කෙටි සටහන් හඳුන්වන්න පුළුවන්. විශාල සටහන් මනසට පීඩනය වැඩි කරන අතර කෙටි සටහන් තුළින් මානසික සැහැල්ලූ භාවය ඇතිකරනවා. තවද විභාග භීතිකාව (Exam phobia) අඩුකර ගැනීමටත් කෙටි සටහන් අපට උදව් වෙනවා.

මේ සියලූ කාරණා වගේම කෙටි සටහන අපට ඕනෑම තැනක රැගෙන ගොස් පාඩම් කිරීමේ හැකියාව නිසා බසයේදී හෝ වෙනත් ඕනෑම ස්ථානයකදී පාඩම් කරන්න පුළුවන්.

අවසාන වශයෙන් මෙවර උසස් පෙළට මුහුණ දෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කියන්න තියෙන්නේ අවසන් මාස දෙක ඇතුළතවත් කෙටි සටහන් භාවිත කරමින් පාඩම් කරන්න. පසුගිය ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවීම මෙන්ම අඩු තරමේ පැය පහක නින්දක් ලැබීම ඔබ පාඩම් කරන දේ මතකයේ වඩාත් හොඳින් රැඳෙන්න උදව්වන බවත් මතක තියාගන්න.

■ ඩී.ඩී. චමින්ද වික්‍රමරත්න

# මට පෙම්වතියක් ඉන්නවා හැබැයි එයා නිළියක් නෙවෙයි

## මාධව විජේසිංහ



කටේ කිරි සුවඳ යන්නටත් කලින් තමන්ගෙ දක්ෂතා රටට ලෝකෙට පෙන්වලා ආදරේ දිනාගත්තු පුංචි දරුවෝ අපේ රටේ වගේම පිටරටවලත් ඉන්නවා. ඒ වගෙ දක්ෂ දරුවන්ව විවිධ රූපවාහිනී වැඩසටහන් තුළින් අපට හමු වී තිබෙනවා. මෑත කාලයේ විශාල ප්‍රේක්ෂක ආකර්ෂණයක් දිනාගත්තු දෙරණ ලිට්ල් ස්ටාර් තරගයත් පුංචි දරුවන්ගේ කලා කුසලතා මතු කළ වැඩසටහනක්. මෙම වැඩසටහන ඉදිරිපත් කරන මාධව විජේසිංහත් කලා ලොවට එක්වුණේ පුංචි තරුවක් විදියට. කටේ කිරි සුවඳ යන්නටත් කලින් නළුකමට එක්වූ මාධව එදා පටන් අද දක්වාම කලා ලොවේ රැඳී සිටින්නේ ඉසව් රැසක් තුළ සිය දක්ෂතා පෙන්වමිනුයි. වේදිකා, ටෙලි නාට්‍ය වගේම සිනමා නළුවෙකු ලෙසත්, වැඩසටහන් ඉදිරිපත් කරන්නකු ලෙසටත් දක්ෂතා දැක්වූ මාධව මේ සතියේ 'රිද්ම' කතාබහකට එකතු කරගන්න අප හිතුවා.

■ **මාධව 'රිද්ම' කතාබහකට එකතු වන පළමු අවස්ථාව නිසා පෞද්ගලික විස්තර ටිකක් කතා කරලාම මේ කතා බහ ආරම්භ කරමු...**

මම පදිංචිවෙලා ඉන්නේ මත්තෙගොඩ. මගෙ පවුලෙ අම්මයි, තාත්තයි, අයියයි, මමයි තමයි ඉන්නේ. අයියා දැන් විවාහකයි. මම මහරගම ධර්මාශෝක විදුහල, මහරගම මධ්‍ය මහ විදුහල හා කොළඹ ලුම්බිණි විදුහලින් අධ්‍යාපනය ලැබුවා.

■ **මාධව නළුවකු වුණේ පුංචිම පුංචි සන්දියේ දී?**

එතකොට මම මහරගම නරිතසං පෙර පාසලේ ඉගෙන ගන්නවා. ඒ දවස්වල අශෝක හඳගම මහතා චන්ද්‍රකින්නරී චිත්‍රපටියට ළමයෙක්ව හොයනකොට මං ගැන කියල තියෙන්නේ ජය ශ්‍රී චන්ද්‍රජිත් මහතා හා චන්ද්‍රසෝම බිංදුහේවා මහතා. ඒ අය හිටියේ අපේ ගෙදර ළඟ. චන්ද්‍රකින්නරී චිත්‍රපටයේ ස්වර්ණා මල්ලවආරච්චි හා හේමසිරි ලියනගේ දෙදෙනාගේ දරුවන්ගෙන් බාලම දරුවගෙ චරිතය රඟපාන්නේ මම.

■ **කුළුඳුල් රංගනය මතකද?**

ලොකු මතකයක් නැහැ. දර්ශන දෙක තුනක් මතකයි. ඒත් රඟපානවා කියන හැඟීමක් තිබුණේ නැහැ. සාමාන්‍ය ජීවිතයේ කරන කියන දේවල් ඒ විදියටම කළා.

■ **චන්ද්‍රකින්නරී චිත්‍රපටයේ මතකයේ රැඳුණු දර්ශන මොනවාද?**

හා හා පුරා කැමරාවක් ඉදිරියේ රඟපෑ දර්ශනය මතකයි. මම මේසය උඩට නැගලා සීනි බෝතලෙයි, පිටි බෝතලෙයි ඇරලා කනවා. ඒ වෙලාවේ අම්මා එනවා. මම මේසෙන් බිමට පැනලා දුවලා යනවා. ඒ වගේම තවමත් මතකයේ රැඳුණු තවත් දර්ශනයක් තිබුණා. චිත්‍රපටයේ මගෙ ආච්චි (දෙනවක හාමිනේ) බිම වැටෙනවා. ඒ වෙලාවේ මමයි චිත්‍රපටයේ මගෙ සහෝදර සහෝදරියෝ ටිකයි හිනා වෙනවා. ඒ දර්ශනය රූගත කරන්න පටන් ගත්තා. අපිට හිනාවෙන්න කිවුවා. ඒත් ස්වාභාවික විදියට හිනාව එන්නෙම නැහැ. පස්සෙ රුක්මල් නිරෝෂ් අයියා කැමරාව පිටුපස ඉඳලා අපිව හිනැස්සුවා. අපිට නවත්තගන්න බැරි තරං හිනාගියා. ඒ සීන් එකත් මතකයි.

■ **ඒ වගෙ අත්දැකීම් හින්දා නළුකම ගැන උනන්දුවක් ඉබේම හිතේ ඇතිවුණාද?**

ඇත්තටම සිදුවුණේ ඒකම තමයි. පුංචිම කාලේ චිත්‍රපටයකට එකතු වෙන්න ඉඩ ලැබුණම මටත් ඉබේම කලාවට උනන්දුවක් ඇතිවුණා. අම්මලත් මාව ඊට යොමු කළා. ඊට පස්සෙ තමයි දිගටම ඒ තුළින් ගමනක් ආවේ.

■ **ඒ කාලය ගැන කතා කළොත්?**

වෙළෙඳ දැන්වීම්වල හිටියා. පාසලේ යාළුවෝ කට්ටියත් එක්ක එකතු වෙලා නාට්‍ය කළා. "සිරස රන්සිත් යාය" වැඩසටහන තුළ හිටියා. ධනුක ඩිල්ෂාන් , හර්ෂණ බෙත්මගේ , ලුම්බිණි විදුහලේදී මාත් එක්ක කලා කටයුතුවලට දායක වූ අය. වසන්ත ඥානප්‍රිය සර් අපගෙ ඉදිරි ගමනට ලොකු සහයක් දුන්නු කෙනෙක්.

■ **ඊට පස්සේ ..?**

ඔය කිවූ සියලුම කටයුතු කළා. හැබැයි අධ්‍යාපන කටයුතුවලට බාධාවක් වෙන්න නම් ඉඩ දුන්නේ නැහැ. ඔය අතරේ තමයි 'දෙරණ ලිට්ල්ස් ස්ටාර්' වැඩසටහනට නවක නිවේදකයකු හොයමින් සිටින බව දැන ගන්න ලැබුණේ. ඒ ආරංචිය මට ගෙනාවේ මගෙ මිතුරියක වන වොල්ගා. ඒ සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වුණාට පස්සේ මට ලිට්ල් ස්ටාර් වැඩසටහනට එකතු වෙන්න ලැබුණා. එදා ඉඳන් අද වනතුරු එම වැඩසටහන තුළ නිවේදකයකු ලෙස රැඳී සිටිනවා.

■ **ළමා නළුවකු විදියට ක්ෂේත්‍රයට ආවට මාධව ජනප්‍රිය වුණේ මෑත කාලයේ රඟපෑ ටෙලි නාට්‍යවලින්..?**

ඒ ගැන කතා කරද්දි මට රවීන්ද්‍ර විජේරත්න හා තරංග දිසානායක අයියලාව මතක් කළ යුතුමයි. මම රවී අයියගේ නාට්‍ය වැඩමුළුවලට ගියා. රවී අයියගෙ 'තූර්යා' නාට්‍යයට මේ දවස්වල එක් වී සිටිනවා. නමුත් මම මෑත කාලයේ ටෙලි නාට්‍යවලට එක් වුනේ ජනක සිරිවර්ධනගේ 'වස්සාන සිහිනය' ටෙලි නාට්‍යයෙන්. මමයි දිනක්ෂියි දෙදෙනා ප්‍රථම වරට ප්‍රධාන චරිත සඳහා එක්වුයේ මේ නාට්‍යයේ ප්‍රධාන නළු නිළි යුවළ විදියට.

■ **දැන්නම් කාර්යබහුල නළුවෙක් නේද?**

'රතා' 'සිහින කිරිල්ලී'. 'තූර්යා' හා 'පාරා වළලු' නාට්‍ය සඳහා තමයි මේ දිනවල එක්වී සිටින්නේ. ඊට අමතරව තිරගතවීමට නියමිත 'අනගාරික ධර්මපාල' තුමාගේ ජීවන චරිතය ඇසුරින් කළ නිර්මාණයේත් මම වර්තමාන කාලයේ ජීවත්වන අනගාරික ධර්මපාල චරිතය ගවේෂණය කරන තරුණයෙකුගේ චරිතයක් රඟපානවා.

■ **නළුකම හා නිවේදනය තුළ විතරද මාධව නිරත වී සිටින්නේ..?**

මම මත්පැන් හා දුම්වැටි භාවිතයෙන් තොරයි. මත්පැන් හා දුම්වැටි භාවිතයෙන් තරුණ පරපුර ගලවා ගැනීම සඳහා වූ රාජ්‍ය නොවන සංවිධානයේත් කටයුතු කරනවා. ඒක වෘත්තිය මට්ටමින් පූර්ණකාලීනව කරන දෙයක් නෙමෙයි.

■ **මාධවගේ ආදරය දිනූ පෙම්වතිය ගැන දැනගන්න 'රිද්ම' හිතවතුන් කැමති වේවි...**

(හිනැහී) පෙම්වතියක් ඉන්නවා. ඇ ගැන වැඩිදුර තොරතුරු ඉදිරියේදී කියන්නම්.

■ **මාධවගෙ ප්‍රේමවන්තිය නිළියක් කියලා ඇතැම් අය කියනවා....**

(හිනැහී) ඒක බොරු කටකතාවක්. මගෙ සමකාලීන නිළියෝ ගොඩක් අය මගෙ මිතුරියෝ. හැබැයි මගෙ පෙම්වතිය ඒ අතර නැහැ. මගෙ පෙම්වතිය කලාව ගැන හොඳ රසාස්වාදයක් තියෙන කලාවට ලැදි කෙනෙක්. නමුත් නිළියක් නෙමෙයි.

■ **ආරියවංශ කුලතිලක**



# නිතර හැදෙන හිසරදය ගැන ඔබ දැනගත යුතු කරුණු ටිකක්

හිසරදය නොහැදුනු කෙනෙක් මේ ලෝකෙ නැති තරම්. අප අතර බහුලව තිබෙන රෝග ලක්‍ෂණය වන්නෙත් හිසරදයයි. එනිසා මේ මොහොතේ ඔබට හිසරදයක් නොතිබුණත් කොයි මොහොතක හෝ මෙය හට ගත හැකියි. මෙහිදී කළ යුතු දේ ගැන දැන ගැනීම මේ නිසා හොඳයි.

නිදි මැරීම, පීන්නට හසුවීම, සෙම්ප්‍රතිශ්‍යාව, පීනස හේතු කොට ගෙන හිසේ සෙම තදවීම නිතර දක්නට ලැබෙන තත්ත්වයක්. ඔබේ නළලට අත තබා බලන විට ඔබේ අතට හසුවන්නේ හිස්කබල නම් අස්ථියයි. එම හිස්කබල තුළ නාසයට උඩින් මේස ලාච්චු වැනි කුහර කිහිපයක් තිබෙනවා. එම කුහර තුළ නිරතුරු ඇතිවන නොතමනය බට වැනි නාළ කිහිපයක් දිගේ නාසය තුළට පැමිණිය යුතුයි. මේවා අවහිර වීම නිසා සෙම තදවීමෙන් දැඩි හිසරදයක් හට ගත හැකියි. සයිනොසයිටිස් නමින් හඳුන්වන්නේ මේ හිසරදයයි. මෙය ප්‍රතිකාර මඟින් සුව කළ හැකියි.

හිසේ ලේ නහරවලින් ද හිසරදය හටගන්නට පුළුවන්. මෙයද නිතර දක්නට ලැබෙන තත්ත්වයක්. එකවරම ලේ නහර හැකිළීම නිසා අමුතු දේවල් ඔබේ දෑස් ඉදිරියේ පෙනීමට පටන් ගන්නවා. සමහරුන්ට ඇස් ඉදිරියේ ගමන් කරන විදුලි එළි එසේ නැත්නම් තද අන්ධකාරයක්, අඳුරු බෝල, පාට පාට එළි වැනි නොයෙකුත් දේවල් දිස්වනු ඇති. ඉන්පසුව සිදුවන්නේ හැකිලුනු ලේ නහර එක්වරම දිග හැරීමයි. මෙය දැඩි හිසරදයක් බවට පත් වන අතර ඊට කළ හැකි කිසිවක් නෑ. මෙහිදී ඔබ කුමන ස්ථානයක සිටියත් ඔබට නිදා ගැනීමට සිදුවනු ඇති. බොහෝ විට මෙම දැඩි හිසරදය අවසන් වන්නේ වමනය දැමීමෙනුයි. තරුණ වයසේ සහ මැදිවියේ අයට වැළඳිය හැකි මෙවැනි තත්ත්වයක් නිසා තමාගේ එදිනෙදා වැඩකටයුතු පවා අතපසු වෙනවා. මේ රෝග තත්ත්වය තමයි මීග්රේන් කියලා හඳුන්වන්නෙ. මෙය කිසිදු වැඩක් කරගත නොහැකි තරමට අධික හිසරදයක් වන රෝග තත්ත්වයක්. මීට ප්‍රත්‍යක්‍ෂ ප්‍රතිකාර දැන් තිබෙනවා.

> “හිසරදයක් ආරම්භ වී එය ක්‍රමයෙන් උත්සන්න වන්නේ නම් ඇතැම්විට මොළය තුළ ගෙඩියක් හෝ සැරව ගෙඩියක් වීමට බැරිකමක් නෑ. එවැනි තත්ත්වයක් නම් ශල්‍යකර්මයකට යොමු විය යුතුයි.”



කායික රෝග විශේෂඥ වෛද්‍ය
**උපුල් ද සිල්වා**

මොළයේ ඇතුළේ නහරයක් පිපිරීමකදීත් ඉතා දැඩි හිසරදයක් එක්වරම හට ගන්නවා. මෙය කොයිතරම් තදින් දැනෙන්නේ දැයි කිවහොත් හිසට පොල්ලකින් ගැහුවාක් බඳු හැඟීමක් ඔබට ඇති විය හැකියි. මෙය ජීවිතයට අනතුරක් කිරීමට ඉඩ ඇති බැවින් වහා රෝහල් ගත විය යුතුයි.

හිසරදය සමඟ උණ, සිහිකල්පනාව වෙනස්වීම මොළයේ ආවරණවලට විෂබීජයක් ඇතුල්වීමක් විය හැකියි. වෛද්‍යවරයකු විසින් රෝග ලක්‍ෂණ පරීක්‍ෂා කර මෙය හඳුනා ගත යුතුයි. ඉක්මනින් උත්සන්න විය හැකි මේ රෝග තත්ත්වය මෙනින්ජයිටිස් නමින් හඳුන්වනවා. එය ඉබේ සුව වන්නෙ නෑ. ඉන්ජෙක්ෂන් ප්‍රතිකාර අනිවාර්යයි. එනිසා එවැනි රෝග ලක්‍ෂණ හට ගත් විට රෝහල් ගතවීම ඉතාමත්ම සුදුසුයි.

හිසරදයක් ආරම්භ වී එය ක්‍රමයෙන් උත්සන්න වන්නේ නම් ඇතැම්විට මොළය තුළ ගෙඩියක් හෝ සැරව ගෙඩියක් වීමට බැරිකමක් නෑ. එවැනි තත්ත්වයක් නම් ශල්‍යකර්මයකට යොමු විය යුතුයි.

මීට අමතරව දත්, ඇස්, කන්, බෙල්ලේ කොඳු ඇට ආශ්‍රිත රෝග බොහෝමයක් නිසාත් හිසරදය හටගන්න පුළුවන්. මෙහිදී රෝගීන් කරන්නේ ඔවුනට තේරෙන තරමට ස්නායු, ඇස් හෝ උගුර, කන, නාසය සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයෙකු වෙත යාමයි. නමුත් මෙය ඔබ සිතාගෙන සිටි අන්දමේ රෝගයක් නොවෙයි නම් එම වෛද්‍යවරයාගේ සීමාවන්ට හසුනොවීමටද පුළුවන්. එනිසා ඔබ කළ යුත්තේ මුලින්ම ඔබේ පවුලේ වෛද්‍යවරයා වෙත යාමයි. පසුව අවශ්‍ය නම් කායික රෝග විශේෂඥ වෛද්‍යවරයෙකු වෙත යොමුවිය හැකියි. එම වෛද්‍යවරයාට අයත් සීමාවටද පටහැනි නම් අදාළ ස්ථානය වෙත යොමු කිරීම ඉන්පසුව සිදුවනු ඇති.

ඉහත දැක්වූ කුමන හේතුවක් මත හිසරදය හට ගෙන ඇතිදැයි ඔබටම වෛද්‍යවරයාගෙන් අසා දැනගන්නට පුළුවන්. හිසරදයේ ප්‍රමාණය මත එහි බරපතලකම තීරණය කළ නොහැකියි. නිදසුනක් ලෙස මොළයේ ගෙඩියක් වැනි තත්ත්වයක් මුලදී හිසරදයක් පමණක් වන්නට පුළුවන්. මොළය අවට ආවරණයට විෂබීජයක් ඇතුල්වීම, මොළය තුළ ලේ නහරයක් පිපිරීම වැනි මේ සිනෑම දෙයක් සඳහා රෝග ලක්‍ෂණ පරීක්‍ෂා කර රුධිර පරීක්‍ෂණ, එක්ස් රේ, ස්කෑන් ආදී සියලුම පරීක්‍ෂණ කර රෝගය හඳුනාගෙන නිවැරදි ප්‍රතිකාරය ලබාගැනීමේ පහසුව රෝහල් තුළ තිබෙනවා.

සාකච්ඡා කළේ -
■ ඉන්දු පෙරේරා







# නැතිබැරිකම ඔබේ දැවැන්ත දියුණුවේ මුල් ගල කරගන්න



## මල් දෙවැට

රැකියාවක් නැති එක පුද්ගලයෙක් කාලයක් තිස්සේ විවිධ රැකියාවල් හෙව්වත් හම්බ වෙලා නෑ. මොකක් හරි හේතුවකට ඔහුට ඒ තරම් දුරට ඉගෙනගන්න අවස්ථාවක් තිබිල නෑ. වැඩිපුර ඉගෙන ගෙන නැති නිසා කිසිවෙක් ඔහුට රැකියාවක් දෙන්න කැමති වෙලා නෑ.

කෙසේ වෙතත් ඔහු සතුව එක් විශිෂ්ට ගුණාංගයක් තිබිල තියෙනවා. ඒ තමයි මොනම දුෂ්කරතාවක් ආවත් උත්සාහය අත අරින්නේ නෑ කියන අධිෂ්ඨානයෙන් වැඩකිරීමේ පුරුද්ද.

කොහොම හරි ඉතා සුළු වේතනයක් ලැබෙන පුංචි රැකියාවක් හරි කරනව කියල හිත හදාගත ලොකු කොම්පැනියක පොඩි රැකියාවකට ඔහු ඉල්ලුම් පත්‍රයක් දාලා. සම්මුඛ පරීක්ෂණයෙන් පස්සෙ පොඩි ප්‍රායෝගික අභ්‍යාසයකුත් දීල. ඒ තමයි කාර්යාලය අතුගාන්න. එයා ඉල්ලල තිබුණ රැකියාව තමයි කාර්යාලය පිරිසිදු කිරීමේ කාර්යය.

ඔහුව රැකියාවට තේරිලා.

"අපි ඔබව තෝර ගන්නව රැකියාවට. ඔබේ ඊමේල් ලිපිනය දෙන්න. වැඩිපුර විස්තර අපි ඊමේල් එකෙන් දන්වන්නම්"

සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා කිව්වලු.

"මට ඊ මේල් එකක් නැහෙ... ඊමේල් තියා කොම්පියුටරයක්වත් මට නෑ. ඒ තරං වත්කමක් මට නෑ..."

අර රැකියාව බලාපොරොත්තු වෙන පුද්ගලයා කිව්වලු.

"එහෙම නං ඉතිං කනගාටුයි... කොම්පියුටරයක් තියා ඊමේල් ලිපිනයක් වත් නැත්තං ඔබෙන් ඇති කිසිම වැඩක් නෑ. ඔබේ කිසිම වටිනාකමක් නෑ. ඔබට රැකියාව දෙන්න විදිහක් නෑ..."

ඒ කතාව අහල රැකියාව නොලැබෙන නිසා බොහොම හිත් වේදනාවෙන් ඔහු ආපහු ගෙදර එන අතරේදි ඔහු දැක්කලු එක තරමක වයසක කෙනෙක් ලූල්ලු මාළු ඉරටෙකට වැලක් වගේ ඇදාන විකුණන්න වැව දිගේ යන හැටි.

ඔහු වැවෙන් අල්ල ගත්තු ඒ මාළු හවස යන එන කාට හරි විකුණල සොච්චමක් සොයාගන්න කෙනෙක්. ඒක දැකල අර රැකියාවක් නැති තරුණයා හිතුවලු ඒ විදිහට වැව් මාළු අල්ලල කීයක් හරි හම්බ කරගන්න. මාළු අල්ලල කීයකට හරි විකුණන්න ඊමේල් ඕන නැහෙ කියල හිතල එදා ඉඳලම ඔහු වැව් ඉවුරේ ඉඳගත මාළු අල්ලල සුළු ගණනකට යන එන අයට විකුණන්න පටන් ගත්තලු.

එහෙම එකතු කල සොච්චම් මුදලින් ඔහු ගම්වලට ගිහින් පලා වර්ග සල්ලිදීල අරගෙන ටවුමට ඇවිත් සුළු ලාභයක් තියාගෙන විකුණන්න පටන් ගත්තලු.

ප්‍රවේසමෙන් සහ දැඩි කැපවීමෙන් ටික කලක් මේ විදිහට කළාට පස්සෙ ඔහු ක්‍රමයෙන් සෑහෙන මුදලක් හම්බ කරල මුලින්ම තල්ලු කරන අත් කරත්තෙකින් එළවළු ගෙනියන්න පටන් ගත්තලු. ඊටත් ටික කලකට පස්සෙ ඔහුගෙම කුඩා ලොරියක් මිලදී ගන්න මග පෑදිලා.

මේ විදිහට ඔහු වාහන කීපයක් මිලදීගෙන විශාල ව්‍යාපාරයක හිමිකරුවෙක් බවට පත්වුණෙලු අවුරුදු පහකින් විතර.

මේ විදිහට ජනප්‍රිය ප්‍රසිද්ධ මහා ආහාර පාන ව්‍යාපාර රැසක් ව්‍යාප්ත කරමින් කෝටිපතියෙක් බවට පත් වූ ඔහු තමන්ගෙ ව්‍යාපාර සඳහා රක්ෂණ ආවරණයක් ගැන ඒජන්තවරයෙක් එක්ක කතා කළාලු.

ඒ සාකච්ඡාව අවසානයේදි ඒ නියෝජිතයා මේ ව්‍යාපාරිකයාගේ "ඊමේල් " ලිපිනය ඇහුවලු.

"මට ඊ මේල් එකක් නෑ"

"මොනව? මේ තරං ව්‍යාපාර රැසක් හිමි කෝටිපතියෙක් වූ ඔබට ඊමේල් එකක් නෑ?... ඊමේල් ලිපිනයක් නැතුව මේ තරම් දේවල් ඔබ කරල තියන එකේ, ඊමේල් එකක් තිබුණනං ඔබතුමා අද කොහෙ ඉඳීවිද කියල ඔබතුමා දන්නවද?"

නියෝජිතයා ඇහුවලු

"ඔව්! ඊමේල් ලිපිනයක් තිබුණ නං අද මම ලොකු කොම්පැනියක ඔෆිස් එක අතුගාන කුලීකරුවෙක්..."

ඔහු පිළිතුරු දුන්නලු.

මේක සමහරවිට ඒ තරම් අමුතු කතාවක් නෙවෙයි කියලත් ඔබට හිතෙන්න පුළුවන්.

ඔව්! අන්ත අසරණ තත්ත්වයක ඉඳල හිතන්න බැරි තරම් උසස්. ආර්ථික මට්ටමකට දියුණු වූ සුවිශාල ව්‍යාපාරික ධනවතුන් ගැන අපිට බොහෝ ආදර්ශමත් සැබෑ කතන්දර අහන්න ලැබෙනවා.

ඒත් ඒ වගේ කොච්චර සාර්ථකත්වයේ කතා ඇහුවත් තමන්ටත් ඒ විදිහට දියුණු වෙන්න පුළුවන් කියන මානසිකත්වය ඇතිකරගන්නෙ හරිම ටික දෙනයි.

ඒත් නිතර නිතර පරාජිත කතා අලාභ පාඩු වීම් බංකොලොත් වීම් ගැන කතා අහනවට වඩා ජීවිතය දුක් විඳල සාර්ථක කරගත්තු අය ගැන කතා අහන එක ඇත්තටම හොඳයි. නොදැනුවත්වම ධනාත්මක අධිෂ්ඨානයේ සිතුවිලි අපේ යටිහිතේ සටහන් වෙනව එතකොට.

බලන්න ඉහත කතාවෙන් කියවෙන්නෙ "ඊමේල්" ලිපිනයක් ගැන. ඒ කියන්නෙ නවීන තාක්ෂණයට සම්බන්ධ දෙයක් ගැන.

නවීන තාක්‍ෂණය අපිට කියන්න බැරි තරම් පුදුම හොඳ දේ ලබා දෙන බව ඇත්ත. ඒත් සමහර වෙලාවට නවීන දියුණු තාක්ෂණය ගැන අපිට අවබෝධයක් නෑ. නවීන මෙවලම් උපකරණ යන්ත්‍ර සූත්‍ර අපිට නෑ. සමහර සිසුන්ට කොම්පියුටර් නෑ. සමහර වෙලාවට ටීවී රේඩියෝවත් නෑ.

ඒත් ඒව තිබුණෙ නැති වුණත් අප තුළ දියුණු වීමේ ආශාවත්, දුක් විඳල 'කට්ට කාලා' පසුබට නොවී ඉදිරියටම යන්න තරම් විත්ත ශක්තියක් තියෙනව නං ඕනෑම අභියෝගයක් ජයගන්න පුළුවන් කියන පණිවිඩය අපිට මතක් කර දෙනව ඉහත "ඊමේල්" නොතිබුණු පුද්ගලයගේ කතාවෙන්.

මහා පරිමාණයේ ව්‍යාපාරිකයෙක් වූ නැපෝලියන් හිල් අවුරුදු පහළොවේ දී විතර පත්තර විකුණපු කොලු ගැටයෙක්. ඇමෙරිකාවේ වරක් ජනාධිපති වූ ඒබ්‍රහම් ලින්කන් ලෑලි ගෙදරක අම්මත් එක්ක ජීවත් වූ දර පලපු කෙනෙක්.

අපේ රටෙත් එහෙම දුක දිනා ජයගත් අයගෙ අනන්තවත් කතා තියෙනව.

අපි බොහෝ විට අපිට නැති දේ ගැන තැවෙනව. ඒත් සැබෑ ජයග්‍රාහකයෙක් කියන්නෙ නැති දේ ගැන අඬ අඬා ඉන්නෙ නැතුව, තියෙන දෙයින් උපරිම ප්‍රයෝජන ගනිමින් අධිෂ්ඨානයෙන් යුතුව දියුණුව කරා පසු නොබලා ගමන් කරන කෙනෙක්.

ඉහත කතාවෙ "ඊ මේල්" කියන්නෙ සංකේතයක් විතරයි.

අපි බොහෝ දෙනෙකුට සුව පහසු මන්දිර ,වාහන, වතුපිටි , නවීනතම 'මොබයිල් ෆෝන්' , ඩිජිටල් තාක්ෂණික මෙවලම් හෝ ප්‍රමාණවත් මුදල් පවා නොතියෙන්න පුළුවන්.

ඒත් ඔබට මොළයක් තියෙනව. අදහස් තියෙනව. අවස්ථාව තියෙනව.

ඒ එක්කම "අභියෝග" තියෙනව.

ශක්තිමත් මිනිසුන්ව එළියට බස්සන්නෙ අභියෝග විසින්.

අන්ත කපපුවම ඉහළට ඉගිලුණු රාජාලියෙක් ගැන අපි කලින් කතාවුණා. මේ ඊ මේල් නැති 'අතුගාන පුද්ගලය'ත් ඒ වගේ කතාවක්.

කෙනෙක් ඔබට රැකියාවක් ප්‍රතික්ෂේප කළාට තැවෙන්න එපා. හිතට ගත්තොත් බොහෝ දෙනෙකුට රැකියා අවස්ථාවන් හදා දෙන්න ඔබට හැකිවේවි දවසක.

ඉතින් 'අභියෝග' සහ නැතිබැරිකම ඔබේ දැවැන්ත දියුණුවේ මුල්ගල් බවට පත්කරගෙන ධෛර්යයෙන් පටන් ගන්න.

ඔබ දැවැන්තයෙක් වන එක සිකුරුයි.

■ මයිකල් ඇන්ජලෝ



# රන්වල බළකාය ගෙන එන "ගයමු" දෙවර්ෂ පූර්ණය සමරයි



එදා මෙදා තුර අපේ ගීත ඉතිහාස තුළ බිහි වූ ගීත ප්‍රමාණය අතිවිශාලයි. ඒ අතරින් මතකයෙන් ගිලිහී ගිය ගීත වගේම හැමදාම මතකයේ රැඳුණු, හැමදාම රස විඳින්නට පුළුවන් ගීතත් තියෙනවා. එවැනි සදානුස්මරණීය ගීත නැවත නැවත රස විඳින්නට වගේම ඒ ගීත මුමුණන්නටත් ප්‍රේක්ෂකයන්ට කදිම අවස්ථාවක් උදා කළේ සහන් රන්වල ප්‍රමුඛ රන්වල බළකාය විසිනුයි.

"ගයමු" නමින් ඔවුන් අපූරු වැඩසටහනක් ආරම්භ කළා. ඒ 2012 මාර්තු 30 වැනිදා. සාර්ථක ගමන් මගක පැමිණි 'ගයමු' වැඩසටහන දැන් සූදානම් වන්නේ දෙවර්ෂ පූර්ණය සමරන්නට. ඒ ගැන විමසන්න අපි සහන්ට කතා කළා.

"ගයමු දෙවර්ෂ පූර්ණ වැඩසටහන අප්‍රේල් මාසේ 5 වැනිදා හවස 5.30ට බී.එම්.අයි.සී.එච්. එකේදී පැවැත්වුණා. අවුරුදු දෙක පුරාම අපි පැවැත්වූ වැඩසටහන්වලට ඇතුළත් වූ ගීත අතුරින් තෝරාගත් ගීත මෙහිදී ගැයුණා. වෙනදා වගේම අපි ඒ ගීත ඇතුළත් පොත් පිංචක් ප්‍රේක්ෂකයන්ට ලබා දුන්නා. හැමදාම අපි ගයමු වැඩසටහන කළේ බී.එම්.අයි.සී.එච්. එකේ කමතේදී. නමුත් මෙවර මෙය පැවැත්වුණේ 5 වැනිදා පැවැත් වුණු අවුරුදු උත්සවයට සමගාමීවයි. මෙහිදී ගීත වගේම ඊට අදාළ නර්තන අංග කිහිපයකුත් ඇතුළත් වුණා. නුවන් නයනජිත් කුමාර විසින් මෙම ගීත පිළිබඳ අප නොදත් තොරතුරු ප්‍රසංගය අතරේදී ගෙන ආවා.

'ගයමු' ප්‍රසංගය ආරම්භ වීමත් බොහොම අපූරු කතාවක්. සහන් මේ කතාබහේදී ගයමු සමාරම්භය ගැන මතකය අවදි කළේ මේ විදියට.

"අතීතයේ ඇසුණු අපේ හිත්වල සදා රැඳුණු ගීත තියෙනවා. නමුත් යම් යම් හේතු මත අද ඒ ගී ඇසෙන්නේම නැති තරම්. ඒ හින්දම අද පරපුර ඒ ගීත දන්නේ නැහැ. මම ඔය කාරණය වටහා ගත්තේ අපේ සිසු පිරිසගෙන්. මම අපේ පංතිවලට එන අයට ගී ගයන්න කියුවම මම කී විදියේ ගීත ගැයෙන්නේම නැහැ. ඒ ගීත දන්නවාද කියා ඒ අයගෙන් ඇහුවම ඇතැම් ළමයි ඒ ගීත ගැන දන්නෙත් නැහැ. ඒ හිංදා මම අපේ සිසු පිරිසට ඒ අයගේ මවුපිය වැඩිහිටි පිරිස් සමග එන්නට කියා පැවැසුවා. ඒ ආවම අපි හැමෝම එකතු වෙලා මේ ගීත ගයන සැඳෑවක් පැවැත්වූවා. මම අර මුලින් කී විදියේ ගීත අතුරින් තෝරාගත් ගී පොත් පිංචක් විදියට මුද්‍රණය කරලා මේ අය අතර බෙදාදුන්නා. ඊට පස්සෙ ඒ සැම දෙනා සමගම එකතු වෙලා අපි ඒ ගීත ගැයුවා. සැබැවින්ම එය ඉතාම රසවත් හෝරාවක් වුණා. අපේ මේ කර්තව්‍යය දුටු බී.එම්.අයි.සී.එච්. එකේ අධ්‍යක්ෂ ජනරාල් බන්දුල ඒකනායක මහතා මට කතා කරලා මෙය දිගටම කරගෙන යා යුතු කටයුත්තක් බවත් ඒ සඳහා අවශ්‍ය පූර්ණ අනුග්‍රහය ලබා දෙන බවත් කියා සිටියා. ඒ අනුව තමයි "ගයමු" ආරම්භ වුණේ. 2012 මාර්තු 30 දින ප්‍රථම ප්‍රසංගය පැවැත්වුණා. එදා පටන් සැම මසකම අවසන් සෙනසුරාදා බී.එම්.අයි.සී.එච්. එකේ කමතේදී නොමිලේ මෙය පවත්වා ගෙන ආවා. මීට අමතරව මහනුවර, කටුගස්තොට, මහරගම වැනි ප්‍රදේශවල මෙය පැවැත්වූවා. මේ වන විට 35 වතාවක් පමණ 'ගයමු' පවත්වා තිබෙනවා......."

"ගයමු" සඳහාම වෙන්වූ රසික පිරිසක් බිහි වූ බවත්, නිරන්තරව මෙය නරඹන්නට පැමිණීම නිසාම ඒ අය දැන් අන්‍යොන්‍ය සුහද පුද්ගලයන් බවට පත්ව ඇති බවත් සහන් පවසනවා. ප්‍රසංග නරඹන්නට ප්‍රේක්ෂකාගාරයට එකතුවන ප්‍රේක්ෂක සමූහයාට ගායකයා හෝ ගායිකාව සමග එක්ව ගැයීමේ අවස්ථාව උදාවන්නේ නැහැ. නමුත් 'ගයමු' ප්‍රසංගයේ දී එදිනට ගැයෙන ගී පොත් පිංචක් ලෙස රසිකයන්ට ලබා දීමත්, ගායකයා සමග ඒ ගී ගැයීමට ඉඩ ලැබීමත් නිසා මෙහි ජනප්‍රියත්වය වැඩිවී ඇති බවයි සහන් පවසන්නේ.

"හොඳ ගී තිබුණේ අතීතයේ, අද බිහිවන කිසිම ගීතයක් හොඳ නැහැ කියන මතයේ සිටින අය ඉන්නවා. අප ඊට විරුද්ධයි. එදා වගේම අදත් හොඳ ගී තියෙනවා. 'ගයමු' සඳහා මේ සියලුම ගීත අතරිනුයි ගීත තෝරා ගන්නේ. 'ග්‍රැමෆෝන් යුගයේ සිට රිහින්වෝන් යුගය දක්වා යුග යුග තුඩ තුඩ මිම්නෙන අපේ රටේ සදාහරිත ගී" ලෙසින් අප මෙය හඳුන්වන්නේ ඒ හින්දයි. බොහෝ ගීත බිහි වීම පිටුපස සැඟවුණු අපූරු කතා තියෙනවා. ප්‍රසංගය අතර නුවන් නයනජිත් විසින් ඒ ගැන ජනතාව දැනුවත් කිරීමත් 'ගයමු' ආලෝකමත් වීමට හේතුවක්...."

■ කණිෂ්ක තෙවරාතන්ත්‍රිගේ








# කෙස්වැටියෙන් ලෝක වාර්තා තැබූ ඔහු මියගියේත් ජයඝෝෂා මැද්දේ...

අපේ අසල්වැසි ඉන්දියාවේ විවිධ ත්‍රාසජනක ක්‍රියාකර ඉන් ආදායම් ලබන ශිල්පීන් සුලබව හමුවෙනවා. මේ ශිල්පීන් පොදුවේ Stunt Artist යන නමින් හඳුන්වනවා. ඉන්දියාවේදි හමුවන මේ ශිල්පීන් විවිධාකාර දක්ෂතා නිසා ලෝකප්‍රසිද්ධිය දිනා සිටිනවා. මේ අතරින් බොහෝ දෙනෙකු නමකියූ පමණින් හඳුනන කෙනෙකු තමයි සයිලේන්ද්‍රනාත් රෝයි කියන්නේ. 48 හැවිරිදි තිදරු පියෙකු වූ සයිලේන්ද්‍රනාත් රෝයි ත්‍රාසජනක ක්‍රියාවල නියැළුණේ තමන් කළ රැකියාවෙන් ජීවත් වෙන්න තිබුණ අසීරුතාව නිසා බවයි ඔහුගේ මිතුරන් පවසනුයේ. වෘත්තියෙන් බටහිර බෙංගාල පොලිස් සේවයේ ස්වදේශ ආරක්ෂක අංශයේ රියැදුරෙකු ලෙස සේවය කළ සයිලේන්ද්‍රනාත් නමින් මේ වන විට ගිනස් වාර්තා තුන හතරක්ම ලියැවී තිබීම ඔහුගේ දක්ෂකමට හොඳම උදාහරණයක්. සයිලේන්ද්‍රනාත්ගේ විශේෂත්වය වනුයේ ඔහු තැබූ සෑම ලෝක වාර්තාවකටම යොදා ගත්තේ ඔහුගේ කෙස්වැටිය වීමයි. ඇත්තටම සයිලේන්ද්‍රගේ කෙස්වැටිය දිගට වැවී තිබුණා පමණක් නොවෙයි. එය ඉතා ශක්තිමත් සහ නිරෝගීව තිබුණා. මේ නිසා අපිට ඇතින් කරන්න අමාරු වැඩ සයිලේන්ද්‍රනාත් සිය කෙස් වැටියෙන් කරන්නට යෙදුනා.

සයිලෙන්ද්‍රනාත් තැබූ පළමු ගිනස් වාර්තාව තැබුවේ 2008 වසරේ. ඒ ටොන් 42ක් බර දුම්රියක් සිය කෙස් වැටිය මගින් මීටර් 25 ක දුරක් ඇදගෙන යාමෙනුයි. ඉන් නොනැවතුණ ඔහු 2011 වසරේ උස් ගොඩනැගිලි දෙකක් අතර මීටර් 70ක් දිග වානේ කම්බියක් ඇද තම දිගු කෙස් වැටියෙන් එම කම්බියේ එල්ලී ගොඩනැගිලි දෙක අතර ගමන් කර තවත් ගිනස් වාර්තාවක් තැබුවා. මේ සෑම අවස්ථාවකටම පෙර මෙන් පසුත් සයිලේන්ද්‍රගේ කෙස් වැටිය පරීක්ෂාකළ ගිනස් කමිටු නියෝජිතයන් පවා එහි ශක්තිමත් බවෙන් පුදුම වුණා.

තමාගේ මෙම වාර්තාව අලුත් කරන ලෙස සයිලේන්ද්‍රට නිරන්තරයෙන් ඇවිටිලි කරන්න වුණා. ඒත් මේ වනවිට ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය ටිකෙන් ටික පිරී හෙමින් තිබුණා. කොටින්ම ඔහු හෘද රෝගියෙකු බවටත් පත්වී තිබුණා. ඒ නිසාම යළිත් ගිනස් වාර්තා තියන්න ඔහු උත්සාහ කළේ නෑ. නමුත් සයිලේන්ද්‍රගේ බිරිඳ ඔහුට නිතර පැවසුවේ මීටර් 70 වක් හිසකෙස්වලින් එල්ලී ගමන් කිරීමේ වාර්තාව අලුත් කරන ලෙසයි. ඒ විතරක් නෙවෙයි ඒ සඳහා සුදුසු ස්ථාන පවා ඇය නම් කරා. අවසානයේ සයිලේන්ද්‍රනාත් තීරණය කළා මේ අවදානම ගන්න. ඒ අනුව ටීස්ටා නමින් හඳුන්වන ගංගාව හිසකෙස්වලින් එල්ලී තරණය කරන්නට ඔහු තීරණය කළා.

මේ අවදානම් සහිත කටයුත්තට ඔහු තෝරා ගත්තේ ටීස්ටා නදිය මතින් ඉදිකර තිබූ කොරනේෂන් නමැති පාලමයි. පාලම් ඇන්දේ සිට ගඟ හරහා මීටර් 600ක් දිග කම්බියක් ඇද ඒ මතින් තම කෙස් වැටියෙන් එල්ලී ගමන්කර නව ගිනස් වාර්තාවක් තැබීම ඔහුගේ අරමුණ වුණා.

නියමිත දිනයේ නියමිත වේලාවට ඔහු කෝරනේෂන් පාලම මත සිට කම්බිය දිගේ තම අවදානම් ගමන ඇරඹුවා. කම්බිය දිගේ මීටර් 200ක් පමණ යන විට ඔහුගේ ගමන් වේගය අඩු වුණා. තවත් මීටර් 100ක් විතර යනකොට ඔහුගේ ගමන නතර වුණා. රැස්ව සිටි දහස් ගණනක් දෙනා ඇස් විදහා මුව අයා බලා සිටින්නට වුණා. සයිලේන්ද්‍රනාත් කම්බියේ එල්ලී සිටින ගමන් තම සිරුර සොලවන්නට උත්සාහ ගත්තා. ඔහුගේ දැඟලීම වැඩි වන්නට ගත්තා. පාලම මත සිටි සයිලේන්ද්‍රගේ බිරිඳ ඇතුළු



සයිලේන්ද්‍රනාත් රෝයි

ආධාරකරුවන්, මාධ්‍යවේදීන් ඇතුළු සියලු දෙනා සිතුවේ ඔහුගේ සමතුලිත බව බිඳී යෑම නිසා මෙලෙස දඟලන බවයි.


ඔවුන් සියලු දෙනා ඔල්වරසන් දෙමින් සයිලේන්ද්‍රනාත්ට ජයපතා කෑ ගසන්නට වුණා. මේ වන විට ඔහු මීටර් 300 දුර කම්බිය මතින් ගමන් කර තිබුණා. ඔහුට නව වාර්තාවක් සඳහා යායුතු දුර වුයේ මීටර් 72ක් පමණයි. දැනටමත් සයිලේන්ද්‍රනාත් ලෝක වාර්තාවක් තබා තිබූ බැවින් ඉතිරි දුරගෙන් බිමට බසින්නැයි රැස්ව සිටි අය කෑ ගසන්නට වුණා. ඒත් සයිලේන්ද්‍රනාත් අඛණ්ඩව දඟලන්නටත්, ප්‍රේක්ෂකයන් ජය ඝෝෂා නගන්නටත්වීම හැර වෙන කිසිවක් සිදු වුණේ නැහැ. අවම වශයෙන් විනාඩි 25ක කාලය තුළ ඔහු එක අඩියක්වත් ගමන් නොකිරීම සැමටම ප්‍රශ්නයක් උනා. විනාඩි 30ක් පමණ තම කෙස්වැටියෙන් කම්බියේ එල්ලී දඟලමින් සිටි ඔහු එකවරම නිසල වුවා. දැන් ඔහු සමතුලිත බව ලබාගෙන ඉදිරියට යනු ඇතැයි සිතුවත් සයිලේන්ද්‍රනාත් සෙලවුණේවත් නැහැ.

ටීස්ටා නදිය මැදින් අඳින ලද කම්බියක හිස කෙස්වලින් එල්ලී සිටින සයිලේන්ද්‍රනාත් වෙත ළඟා වන්නට පහසු නැති බව කවුරුත් දැන සිටියා. ඒත් විනාඩි 40කට පමණ පසු දැඩි ආයාසයක් දරා සයිලේන්ද්‍ර ගං ඉවුරට ගෙන එන්නට රැස්ව සිටි පිරිස සමත් වුණා. වහාම රෝහලට රැගෙන ගියත් ඒ වන විටත් ඔහු මිය ගොස් තිබුණා. ඇත්තෙන්ම සිදුව තිබුණේ ටීස්ටා නදිය මැදදී ඔහුට දරුණු ගණයේ හෘදයාබාධයක් ඇති වීමයි. ඉවසාගත නොහැකි වේදනාවෙන් සයිලේන්ද්‍රනාත් දඟලන විට රැස්ව සිටි පිරිස එය වටහාගෙන තිබුණේ ඔහුගේ සමතුලිතභාවය බිඳී ගොස් ඇති ලෙසයි.

සයිලේන්ද්‍රනාත්ගේ කනගාටුදායක ඉරණම දෙස බලා සිටි සුනෙත්‍රා නමැති ඡායාරූප ශිල්පියා BBC මාධ්‍ය ජාලයට පවසා තිබුණේ මිනිසෙකු මරු විකල්පෙන් දඟලන විට ඔහුගේ බිරිඳ ඇතුළු දහස් ගණනක් ඔල්වරසන්දීම තම ජීවිත කාලයේදී අමතක නොවන අත්දැකීමක් බවයි.

පොලීසිය පවසනුයේ මේ ක්‍රියාදාමය සඳහා ඔහු නිසි අවසරයක් ගෙන නැති බවයි. අවම වශයෙන් වෛද්‍යවරයෙකු, ගිලන්රථයක් පවා කැඳවා නැති බවයි. සයිලේන්ද්‍රගේ ක්‍රියාදාමයට පෙළඹවූ ඔහුගේ බිරිඳ මීට වගකිව යුතු බව ඔහුගේ මිතුරන් පවසනවා. මෙය හිතුමතේ ලෝක වාර්තා තියන්න යන කොයි කාටත් සයිලේන්ද්‍රනාත්ගේ ඉරණම හොඳම ආදර්ශයක් බවයි ඉන්දීය මාධ්‍ය වාර්තා කරනුයේ.

■ අරුණ ලක්ෂ්මන් ප්‍රනාන්දු



# සංජීවනීගේ සොඳුරු නිවහනට ගොඩවෙමු



මිදුලක් වැනි බැල්කනිය



සංජීවනී සහ අම්මා





දියණියගේ කාමරය



සාලය



පුතුගේ කාමරය



විශාල ටීවී කාමරය



සංජීවනී වීරසිංහ කියන්නේ නිළියක්, ගායිකාවක්, නිවේදිකාවක් විදියට තමංගෙ කුසලතා පෙන්වූ කලාකාරියක්. මේ සියලු කටයුතු එක්ක කාර්යබහුල වුණත් ඇය තමන්ගෙ ආදරණීය සැමියා සුසන්ත සහ දරු දෙදෙනා සමග ගත කරන්නෙ සුන්දර දිවියක්.

මේ සතියේ අපි "රිද්ම" පාඨක ඔබට සංජීවනීගේ සොඳුරු කැදැල්ලේ ලස්සන තැන් දැක බලාගන්න අවස්ථාව ලබාදෙන්නයි මේ සූදානම.

පර්චස් 20ක් පුරා විහිදුණු ඉඩම මැද පිහිටි නිවහන මිලට අරගෙන තමන්ට අවශ්‍ය විදියට වෙනස්කම් කළ බවයි සංජීවනී පවසන්නේ. ගෙවත්තට අඩු ඉඩක් ලබාදීලා වත්ත පුරාවට නිවස ඉදි වෙලා. සංජීවනීගෙ දරුවො දෙන්නාට චූටිකාලෙදි බයිසිකල් පදින්න වත්තටවත් පාරටවත් යන්න සිදු වුණේ නැතිලු. මොකද නිවහනේ ඉහළ මාලයේ අතිවිශාල බැල්කනිය ඉදිකරලා තියෙන්නේ. දරුවන්ට බයිසිකල් පදින්නත් පුළුවන් විදියටලු.

ඇවැන්ත නිවසේ සොඳුරු තැන් රැසක් තිබුණත් සොඳුරු ස්ථානය විදියට සංජීවනී හඳුන්වන්නේ ඇවැන්ත රූපවාහිනී කාමරය. පවුලේ හතර දෙනාම එකතු වන්නෙ මෙතැනදී වුණත් දරුවන්ගෙ විභාග ළංවුණාම මෙම ස්ථානය තහනම් කලාපයක් වෙනවා. දරුවන්ට විභාගය ළංවන දවස්වලට සංජීවනී සහ සුසන්ත දෙදෙනාත් රූපවාහිනී නරඹන එක නතර කරනවලු.

සංජීවනී ජනප්‍රිය කලාකාරියක්. සුසන්ත ක්‍රිකට් ක්‍රීඩකයෙක්. මේ දෙන්නම සමාජශීලී චරිත නිසාදා නිවහනට පැමිණෙන අමුත්තන්ට අතපය දිගහැරලා ඉන්න පුළුවන් විදියට නිවස වැඩි ඉඩකඩක් ඇතුව හැදුව බව සංජීවනී කියනවා. තමන්ගෙ කාර්යබහුල බවත් එක්ක අති විශාල ගෙවත්තක් කළමනාකරණය කිරීම අසීරු වීමත් නිවසට වැඩි ඉඩක් හා ගෙවත්තට අඩු ඉඩක් වෙන්කිරීමට හේතුවක් බව සංජීවනී වැඩිදුරටත් කියනවා.

"අපි මේ ගෙදරට ආවේ 2006 දී. සුබ නැකැත් බලන්නෙ නැතුවයි අපි මේ ගෙදරට ආවේ. ඒ වගේම නිවස අලුත්වැඩියා කරද්දී දොර ජනේල වෙනස් කරද්දී වාස්තු විද්‍යාවෙ ගැන හිතුවෙත් නැහැ. අපිට අවශ්‍ය විදියට තමයි හැමදේම කළේ. ඒ වුණත් මේ ගෙදරට ආවට පස්සෙ තමයි අපේ ජීවිත ගොඩක් වාසනාවන්ත වුණේ..."

ඡායා :- ජානක කඳනාරච්චි

■ ආරියවංශ කුලතිලක



# ඩේවිඩ් බෙකම් වනගත වෙයි

ප්‍රසිද්ධියට ප්‍රකට පාපන්දු තරුවක් වන ඩේවිඩ් බෙකම් බීබීසී (BBC) ලෝක සේවයෙන් සංවිධානය කරන ලද ගුප්ත චාරිකාවක යෙදී තිබුණේ ජීවිත කාලයටම ලැබෙන මහගු අත්දැකීමක් විඳගැනීමට වගේ. ඔහු මේ සංචාරය සඳහා ගොස් තිබුණේ ලෝක ප්‍රසිද්ධ වැසි වනාන්තරයක් වන ඇමසන් වනාන්තරයේ විනාඩි 90ක වාර්තාමය වැඩසටහනක රූපගත කිරීමක් සඳහායි.

මේ සංචාරය සඳහා බෙකම් සමග ඔහුගේ මිතුරන් තිදෙනෙකු ද ගොස් තිබුණා. ඔවුන් මෙම රූපගත කිරීම සඳහා එක්ව තිබුණේ මෙවර පැවැත්වෙන 2014 ග්‍රීෂ්ම ලෝක කුසලාන පාපන්දු ක්‍රීඩා උළෙල පැවැත්වෙන කාලය සඳහා ප්‍රචාරක වැඩසටහනක් වෙනුවෙනුයි.

මේ පිළිබඳව අදහස් දැක්වූ බීබීසී ලෝක සේවා කළමනාකාර අධ්‍යක්ෂිකා හෙලන් ජැක්සන් මෙය බෙකම්ට ජීවිත කාලයටම අමතක නොවන අත්දැකීමක් වන බවට කිසිදු සැකයක් නැතැයි පවසා තිබුණා. "ඇමසන් වනගහනයේ ඇති බියකරු බව හා සුන්දරත්වය තුළින් නිර්මාණය කළ මෙම වාර්තාමය වැඩසටහන ඩේවිඩ්ගේ ජීවිතයට අමතක නොවන සුන්දර අත්දැකීමක් වේවි" යැයි සඳහන් කළ ඇය තවදුරටත් පවසා තිබුණේ ඔහුගේ දෑස් අතරින් ප්‍රේක්ෂකයාව අද්විතීය ලොවකට රැගෙන යාමට මේ ක්‍රීඩකයාට හැකියාවක් තිබූ බවයි. එමෙන්ම ප්‍රේක්ෂකයාට වනගත ජීවිතයක අත්දැකීම් මේ කෙටි වාර්තා වැඩසටහන තුළින් උකහාගත හැකි වේවි යැයි ද ඇය අනාවැකි පළකොට තිබුණා. ඩේවිඩ් බෙකම්ගේ ජීවිතය පසුගිය වකවානුව තුළ විවිධ හැල හැප්පීම්වලට භාජනය වී තිබූ අතර ඔහු ඉතා ආදරයෙන් වැළඳගත් පාපන්දු ක්‍රීඩා පිටියෙන්ද බෙකම්ට සමුගැනීමට සිදු වුණා. නමුත් මේ ලෝක කුසලාන පාපන්දු ක්‍රීඩා උළෙල වෙනුවෙන් ඔහු පෙනී සිටි දර්ශන නිසා නැවතත් බෙකම් ලොව පුරා මාධ්‍ය තුළින් කතාබහට ලක් වන චරිතයක් බවට පත්වනු ඇතැයිද හෙලන් පවසා තිබුණා.

බීබීසී ලෝක සේවයේ නිෂ්පාදක කණ්ඩායම සති දෙකක් මේ වැසි වනාන්තරයේ රූපගත කිරීම් වෙනුවෙන් ගතකොට තිබුණා. එම සති දෙකේදී බෙකම් කූඩාරම් තුළ ජීවත් වන හැටි ආහාර පිසින අන්දම සහ මාළු බාන අන්දම පිළිබඳව මනා දැනුමක් ලබා ගත්තාලු.

ඩේවිඩ් බෙකම් 2012-2013 පාපන්දු තරගවලින් පසුව පාපන්දු ක්‍රීඩාවෙන් සමුගත්තත් ඔහුගේ හිතේ හා ගතේ තිබෙන පාපන්දු උන්මාදය නම් කෙසේ වත් අඩුවන්නේ නැති නිසා මෙවර පැවැත්වෙන ග්‍රීෂ්ම ලෝක කුසලාන පාපන්දු තරගාවලිය සමග මෙසේ අත්වැල් බැඳගෙන තිබෙන බවයි එරට මාධ්‍ය පවසා තිබුණේ.

## තරු ආරංචි

■ ශිරෝනි ශ්‍රේරෝ

# මයිලි සයිරස් ගමන් කළ බසය පුපුරා ගිනි ගනී

මයිලි සයිරස් ඇයගේ Bangerz (බැන්ගර්ස්) සංචාරයට සහභාගී වී සිටින අතරතුර ඇය ගමන් ගත් බසය "නිව් ඕර්ලන්ස්" හිදී පිපිරීමකට ලක්ව ගිනිගෙන විනාශවී ගොස් තිබුණා.


මෙම සිද්ධිය දුටු පුද්ගලයෙකු මාධ්‍යයට පවසා තිබුණේ එක්වරම ඇය ගමන්ගත් බසයේ ටයරය පුපුරා යාම නිසා මහ ශබ්දයක් සමග ගින්නක් හටගත් බවයි.

මේ පිළිබඳව මාධ්‍යයට තොරතුරු පැවසූ මයිලිගේ සොයුරිය වන නෝහා පවසා තිබුණේ හැමදෙනාම ඉතා ආරක්ෂාකාරීව බසයෙන් ඉවත් වුණ බව සහ කිසිම කෙනෙකුට මේ අනතුරින් හානි නොවූ බවයි.

මෙම සිදුවීම නිසා බසය මුළුමනින්ම විනාශ වී ගොස් තිබුණා. නෝහා හා මයිලි තමන් යාමට නියමිතව තිබූ සංගීත ප්‍රසංගය අතර මග නවතා දමා ළඟම තිබූ හෝටලයක නවාතැන් ගත් බව සඳහන්.

21 වන වියේ පසුවන මේ යොවුන් ගායිකාව පසුගිය වසරේ මුළු ලොවේම ඇස් ඇය වෙත යොමුකර ගැනීමට සමත් වූයේ නිරුවත් රංගනයක යෙදෙමින් ගායනයක් ඉදිරිපත් කිරීම නිසයි. මේ වසරේ මුල මයිලි තවත් අලුත් මුහුණුවරකින් කරළියට පැමිණ ඇත්තේ කොණ්ඩ මෝස්තරය වෙනස් කරගනිමිනුයි. එයින් නොනැවතුනු ඇය තම කටහඬ පවා මේ වසරේදී වෙනස් කරගත් බවයි මාධ්‍යයට අනාවරණය කොට තිබුණේ.

2013 වසරේදී මයිලි තම ඇහිබැමවල වර්ණය වෙනස්කොට තිබුණා. ඒ වගේම ඇය බොහෝ කලක් ප්‍රේමයෙන් වෙළී සිටි තම පෙම්වතා වූ 'ලියම් හෙම්ස් වර්ත්' සමග තිබූ ප්‍රේම සම්බන්ධයද 2013 වසරේදී නවතා දැම්මා. පසුව මයිලි සයිරස් 42වන වියේ පසුවන ඔස්කාර් සම්මානලාභී පේරාස් ලෙටෝ සමග සම්බන්ධයක් ගොඩනගාගෙන තිබුණා.



## දැන්වීම් පුවරුව

# සරසවි නිර්මාණ උළෙලේ සම්මාන ප්‍රදානය



**කලා** භූෂණ රාජ්‍ය සම්මානලාභී ලීල් ආනන්ද ගජනායක 30 වන වරටත් සංවිධානය කළ සරසවි නිර්මාණ සමස්ත ලංකා කෙටි නාට්‍ය හා සරසවි සම්මාන උළෙල කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පසුගියදා පැවැත්වුණි. මෙම උළෙලේ ජයග්‍රාහී කෙටි නාට්‍යවලට අමතරව ප්‍රවීණ කලාකරුවන් කිපදෙනෙක්ද සම්මානයෙන් පුද ලැබීය.

ලූෂන් බුලත්සිංහල, ධර්මසිරි බණ්ඩාරනායක, කුලසිරි බුදවත්ත, අමරසිරි කලංසූරිය, දීපිකා ප්‍රියදර්ශනී, වීණා ජයකොඩි, රොඩ්නි වර්ණකුල, ජගත් චමිල හා ලිලන්ත කුමාරසිරි යන කලා ශිල්පීන් සරසවි නිර්මාණ ප්‍රසාද පූජා සම්මානයෙන් පිදුම් ලැබූ අතර කථිකාචාර්ය සරත් වීරසිංහ සරසවි නිර්මාණ ගෞරව පූජා සම්මානයෙන් පුද ලැබීය.

කෙටි නාට්‍ය අංශයේ සරසවි නිර්මාණ සම්මාන පහත දැක්වෙන පරිදිය, හොඳම නළුවා - වින්සන්ට් කාරියවසම් (දැන්වත් ගහන්න), හොඳම නිළිය - කළණි තිලංකා (මව්වරු සහ පුත්තු), හොඳම සහය නළුවා - වසන්ත රූපසිංහ (මාර්ග අංක අට), හොඳම සහය නිළිය - සංජීලා තත්සරණී (මව්වරු සහ පුත්තු), හොඳම පසුතල නිර්මාණය - ලහිරු දරණකුඹුර (කළුවර නිවාඩුව), ඉනෝකා ශ්‍යාමලී වර්ණකුලසූරිය (කළුවර නිවාඩුව), හොඳම සංගීතය - ජනක උදාර පීරිස් (කළුවර නිවාඩුව), හොඳම ඇඳුම් නිර්මාණය - වික්ටර් මොරවක (දැන්වත් ගහන්න), හොඳම අංග රචනය - ජූඩ් නිරංජන් ප්‍රනාන්දු (දැන්වත් ගහන්න), හොඳම ළමා නළුවා - අවිෂ්ක මල්සර ප්‍රනාන්දු (අතුරුදහන්), හොඳම ළමා නිළිය - සත්‍යා දිව්‍යාංජලී (කළුවර නිවාඩුව)

හොඳම රචනය, හොඳම නිෂ්පාදනය සහ හොඳම රංග වින්‍යාස සම්මාන දිනා ගත්තේ රන්දික විමලසූරිය නිෂ්පාදනය කළ 'දැන්වත් ගහන්න' නාට්‍යය වන අතර පිළිවෙළින් හොඳම නිෂ්පාදනයේ දෙවන හා තෙවන තැන හිමි වූයේ නිලුපුල් කාරියප්පෙරුම නිෂ්පාදනය කළ 'මව්වරු සහ පුත්තු' නාට්‍යයට සහ ලලනි ස්වර්ණා ප්‍රේමසිරි නිෂ්පාදනය කළ 'අතුරුදහන්' යන නාට්‍යයටය.

මෙවර ප්‍රේක්ෂක ඡන්දයෙන් තේරී පත්වූ ජනප්‍රිය නාට්‍යය වූයේ නිලුපුල් කාරියප්පෙරුම නිෂ්පාදනය කළ 'මව්වරු සහ පුත්තු' නාට්‍යයයි.

# පරාක්‍රමගේ කලා දිවිය අගයමින් "චරන්දාස්" රඟදැක්වේ

**ප්‍රවීණ** කලාකරු පරාක්‍රම නිරිඇල්ලයන්ගේ කලා දිවියේ සිව්වන දශකය හා මෙම අප්‍රේල් 18 දිනට එළඹෙන හැටපස් වන ජන්ම දිනය නිමිති කොට "පරාක්‍රම නිරිඇල්ල අභිනන්දන" උළෙල මෙම අප්‍රේල් 05 වන සෙනසුරාදා සවස 6.00ට මහරගම යොවුන් (ලූක්) රඟහලේ දී පැවැත්වීමට, "ගැමි දරුවෝ" පේරාදෙණිය සරසවි මිතුරෝ සංවිධානය කටයුතු යොදා ඇත.

SHARE THE LOVE
Love the Environment as thy self
Relaxation Music
Rev Bibiladeniye Mahanama Thero




# සංයුක්ත තැටිය තුළින් අධ්‍යාත්මයට ආමන්ත්‍රණය කරන බිබිලාදෙණියේ මහානාම හාමුදුරුවෝ

SHARE THE LOVE

තොටිල්ලේ නැලවෙන බිළිඳාගේ පටන් සැරයටියේ වාරුව ලබන වියපත් මහල්ලා දක්වා සැම සියලු දෙනාම සංගීතය රසාස්වාදනය කරනවා. මේ රසාස්වාදය, පුද්ගලයාගේ මානසික මට්ටම අනුව වගේම සංස්කෘතිය අනුවත් වෙනස්වෙනවා. යම් කොට්ඨාසයකට ඝෝෂාකාරී වන සංගීතය තවත් පිරිසක් ආදරයෙන් වැළඳ ගන්නේත් පිරිසකට භාව පූර්ණ වන සංගීතය තවත් පිරිසක් බැහැර කරන්නේත් ඒ නිසයි. කොයි ආකාරයෙන් බැලුවත් සංගීතය කියන්නේත් මිනිස් සිත තුළ අපූර්ව උත්තේජනයක් ඇති කරන්නට සොබාදහම දුන් විශිෂ්ට තිළිණයක්. සංගීතවේදීන් විසින් තම ඥාන පරාසයේ තරම අනුව මේ තිළිණයේ වටිනාකම අඩුවැඩි කරනවා. නමුත් අධ්‍යාත්මයට කා වැදී බලපෑම් ඇති කරවන්නට තරම් ප්‍රබල විදියට වුවත් සංගීතය භාවිතා කළ හැකියි. ලෝකයේ විශිෂ්ට සංගීතවේදීන් විසින් එවන් අපූරු සංගීත සංධ්වනි බිහිකොට තිබෙනවා.

පසුගියදා එවන් සුවිශේෂ සංගීත තැටියක් එළි දැක්වුණා. **Share the Love** නමැති මෙම සංගීත තැටියේ අඩංගු වෙලා තියෙන්නේ සංගීත නිර්මාණ 12ක්. සංගීත නිර්මාණයක් කී සැණින් අද බොහෝ අය හිතන්නේ රචකයා ගායකයා හා සංගීතවේදියා එක්වී බිහි කරන ගීතයක් විදියට. නමුත් සංගීත නාදමාලා පමණක් යොදාගනිමින් පුළුල් පරාසයකට විහිදී යන පරිදි නිර්මාණය වූ සංගීත නිර්මාණ පවතිනවා. එවන් නිර්මාණ 12ක් තමයි **Share the Love** සඳහා ඇතුළත් වන්නේ. මෙය මිනිස් මනස ලිහිල් කිරීම සඳහා යොදාගන්නට ඇති නිර්මාණ සමුච්චයක්.

**Share the Love** සංයුක්ත තැටියක් ලෙස හැඳින්වුවාට ඇත්තටම එය පොතක්. ඒ පොත තුළ මෙම සංගීත නිර්මාණ දොළහ පිළිබඳවත් එය රස විඳින ආකාරය ගැනත් දැක්වෙනවා. පුද්ගලයා අනුව රසඥතාවය වෙනස් වන බව අප මුලිනුත් සඳහන් කළානේ. **Share the Love** මේ සැම රසඥතාවයෙන් යුතු පුද්ගලයෙකුටම ගැළපෙන ආකාරයට නිර්මාණය වූ පර්යේෂණාත්මක නිර්මාණයක්. හින්දුස්ථානි රාගධාරී සංගීතය, බටහිර සංගීතය ඇතුළු ලෝකයේ විවිධ රටවල තිබෙන සංගීත නාද මාලා ස්පර්ශ කරමින් නිර්මාණය වූ මෙම සංගීත නිර්මාණ දොළහ උසස් රසඥතාවයෙන් යුතු රසවතුන්ට ගැඹුරින් රස විඳින්නට හැකි වගේම සාමාන්‍ය ජනයාට තම රස මට්ටමේ සිට විඳිය හැකි වීම **Share the Love** තුළ වූ විශේෂත්වය වනවා.


පුරා වසර හතරක් තිස්සේ පර්යේෂණයේ යෙදෙමින් **Share the Love** නිර්මාණය කළ නිර්මාණකරුවාත් අපේ සංගීත ක්ෂේත්‍රයට සුවිශේෂී අයෙක්. ඊට හේතුව වන්නේ මෙම නිර්මාණකරුවා ගිහි ජීවිතයෙන් බැහැර අයකු වීම, යෙයර් ද ලව් නිර්මාණකරු පූජ්‍ය බිබිලාදෙනියේ මහානාම ස්වාමීන් වහන්සේයි. අපේ ගීත රචනා කලාවට හා කවියට සංඝයා වහන්සේලාගේ දායකත්වය එක්වී තිබුණත් සංගීත අධ්‍යක්ෂණයට පිවිසි ප්‍රථම ස්වාමීන් වහන්සේ වන්නේ පූජ්‍ය බිබිලාදෙණියේ මහානාම ස්වාමීන් වහන්සේයි. උන්වහන්සේ රිද්ම කතා බහකට එකතු වුණේ මේ ආකාරයට.

> “අපේ ගීත රචනා කලාවට හා කවියට සංඝයා වහන්සේලාගේ දායකත්වය එක්වී තිබුණත් සංගීත අධ්‍යක්ෂණයට පිවිසි ප්‍රථම ස්වාමීන් වහන්සේ වන්නේ පූජ්‍ය බිබිලාදෙණියේ මහානාම ස්වාමීන් වහන්සේයි.”

“අප ඉතිහාසය විදියට දකින්නේ ක්‍රි.පූ. 236න් පසු එනම් මිහින්දාගමනයෙන් පසු ඉතිහාසයයි. එහිදී සූසැට කලාවන් අපට ලැබුණා. එය විකාශය වීම තුළින් අපේම කලාවක් බවට පත්වුණා. මේ කටයුත්තට සංඝරත්නයේ දායකත්වය මුල්වුණා. කවිය හා සාහිත්‍යය ගෙන බැලුවොත් “සැලලිහිණිය” වැනි කෘතීන් රැසක් බිහි කළේ සංඝයා වහන්සේලා විසිනුයි. නමුත් සංඝයා වහන්සේ නමකට කැප අකැප දේ පිළිබඳ ඇති මතවාද නිසා මේවාට ඒ කාලවලදී නොයෙක් විරෝධතා එල්ල වුණා. නමුත් උන්වහන්සේලා ඒ විරෝධතා නොතකා කාලයේ අවශ්‍යතා වටහාගෙන සිය කටයුතුවල යෙදුණු නිසා එය කලාවේ ප්‍රගමණයට හේතු වුණා. අද වන විට අපේ සාහිත්‍යයත් අපේ කවියත් අපට තියෙනවා. ඒත් තවමත් අපිට අපේ සංගීතය යැයි කියන්න සංගීතයක් නැහැ. ඊට හේතුව ඉතිහාසයේදී සංගීතයට ස්වාමීන් වහන්සේලාගේ දායකත්වයක් නොවීම. මම සංගීත නිර්මාණ සඳහා එක්වීමේදීත් කැප අකැප පිළිබඳ විවිධ අදහස් මතුවුණා. ඒත් අද දවසේ සංගීතය දිහා බැලුවම අපිට දකින්නට ලැබෙන්නේ ලොකු මාල,කරාබු දාගෙන බාච්චු, ඇඳුම් ඇඳගෙන බටහිරටත් නැති පෙරදිගටත් නැති ඝෝෂාකාරී සංගීතයක් වැළඳගත් පිරිසක්. මේ යුගයට හොඳ සංගීතයක් බිහි කිරීම කාලීන අවශ්‍යතාවයක්. ස්වාමීන් වහන්සේ නමක් විසින් කාලීන අවශ්‍යතාවය ඉටු කිරීම කැප දෙයක් මිස අකැප දෙයක් නොවෙයි. ඒ නිසයි මම මේ කාර්යයට එකතු වුණේ.”

බිබිලාදෙණියේ ඉපදිලා වයස අවුරුදු 10දී දිග්ගල ශ්‍රී ශෛලතලාරාමයේදී පැවිදි බිමට එක්වූ පූජ්‍ය බිබිලාදෙණියේ මහානාම ස්වාමීන් වහන්සේ දැනට වැඩ වාසය කරන්නේ රාජගිරිය සදහම් සෙවණේ. උන් වහන්සේ සංගීතය හදාරන්නට එක්වුණේ වයස අවුරුදු16දී. විශාරද වෙනිස්ටර් පෙරේරා, දයාරත්න රණතුංග, ඩිලුක් ගබඩාමුදලිගේ යන සංගීත ආචාර්යවරුන් යටතේ සංගීතය හැදෑරූ උන් වහන්සේ ඉන්දියාවේ මුම්බායි නුවර ඔස්තාද් ගුලාම් නියෝස්ඛාන් වෙතින් හින්දුස්ථානි, සංගීතයත් ට්‍රිනිටි කොලේජ් ඔෆ් ලන්ඩන් වෙතින් බටහිර සංගීතයත් හදාරා තම සංගීත ඥානය වැඩිදියුණු කරගෙනයි සංගීතයට එක්වුණේ. මේ වන විට විශිෂ්ට නිර්මාණ රැසකට සංගීත අධ්‍යක්ෂණයෙන් එක්වූ බිබිලාදෙණියේ මහානාම ස්වාමීන් වහන්සේ ආකර්ෂ දිපා යන කන්නඩ චිත්‍රපටයේත් ශිලා “ඇන්ඩ් ද මාරියස් යන ජර්මන් චිත්‍රපටයේත් සංගීත අධ්‍යක්ෂවරයා වනවා. පසුගියදා නිකුත් වූ පූජ්‍ය බිබිලාදෙණියේ මහානාම ස්වාමීන් වහන්සේගේ **Share the Love** ගැන උනන්දුවක් දක්වන අයට 0773616638 (අරුණ) හා 0777535949 (රැක්ෂාන්) 0713177515 (බන්දුල) ඇමතීමෙන් මේ ගැන දැනගන්නට පුළුවන්. ඒ වගේම www. Sharethelovemusic.com වෙබ් අඩවියෙන් මේ ගැන විස්තර දැනගන්නත් පුළුවන්.

■ **ආරියවංශ කුලතිලක**



# නිරෝෂන් ඉඳුල් කටගෑවේ සුරතල් පූසාගේ බත් පිඟානෙන්ලු







නිරෝෂන් චූටිකාලේදී

## චූටි කාලේ වෙච්ච දේවල්

'රිද්ම චූටි කාලේ වෙච්ච දේවල්' තුළින් අපි හැම සතියකම අපේ ජනප්‍රිය කලාකරුවකුගේ හෝ කලාකාරියකගේ චූටි කාලේ තොරතුරු අරගෙන එනවා. මේ සඳහා තොරතුරු විමසන්න බොහෝ විට අපි කතාබහට එකතු කරගන්නේ අප තෝරාගත් කලා කරුවාගේ හෝ කලාකාරියගේ මව. ඉතින් මේ සතියේ අපි ගෙන එන්නේ ජනප්‍රිය රංගන ශිල්පී නිරෝෂන් විජේසිංහගේ චූටි කාලේ තොරතුරු. ඒ සඳහා අපි කතාබහට එකතු කරගත්තේ නිරෝෂන්ගේ ආදරණීය මව වන එන්.පී. ධනවතී මහත්මිය.

"මගේ මල්වර මංගල්‍යය සඳහා නැකැත් බැලුවම අනාගතය ගැන සඳහන් කෙරුණා. මට පුත්තු දෙදෙනකුගේ සහ දුවලා දෙදෙනකුගේ දරුපල තිබෙන බව එහි සඳහන් වුණා. ඒ අතරින් එක දරුවෙක් රටේ ජනප්‍රිය චරිතයක් වන බවත් සඳහන් වුණා... ඒ කිව්ව විදියටම පස්සෙ කාලෙක විවාහ වුණාම මට පුත්තු දෙදෙනකුයි දුවල දෙදෙනකුයි ලැබුණා. ඒ අයගෙ කේන්ද්‍රවල නම් කලාව ගැන සඳහන් වෙලා තිබුණෙ නැහැ. ඒත් පොඩි පුතා කලාවට එකතු වුණා. මගෙ මල්වර නැකැතේ අනාවැකිය හරි ගියා..."

ධනවතී කතාබහට එකතු වුණේ ඒ විදියට. ධනවතී හා ඇගේ සැමියා ඩබ්ලිව්. පී. ස්ටීවන් පදිංචි වෙලා හිටියේ මිනුවන්ගොඩ හා මීගමුව අතර තියෙන කොරලගහවත්ත කියන සුන්දර ගමේ. මේ අයට පුතෙක් හිටියා. ලොකු පුතාට අවුරුදු එකහමාර වෙද්දී මේ අයගෙ පොඩි පුතා ඉපදුනා. 1974 -07-02 වැනිදා දූනගහ රෝහලේදී මෙලොව එළිය දුටුව මේ යුවලගෙ පොඩි පුතා විජේසිංහ පතිරගේ නිරෝෂන් විජේසිංහ .

එහෙත් නැතිනම් නළුවකු විදියට රටම හඳුනන නිරෝෂන් විජේසිංහ.

"පොඩි පුතා ඉපදුනකොට හරිම ලස්සනයි. ඒත් මට එයා එක්ක ගත කරන්න ලැබුණේ දවස් 5 යි. ලොකු පුතාට තදබල අසනීපයක් වැළඳිලා රෝහල් ගත කළ හින්දා මට එයා ළඟ ඉන්න සිදුවුණා. මමයි ලොකු පුතයි ඉන්න කොළඹ නෝනා වාට්ටුවට පොඩි පුතාව ගෙනියන්න වෛද්‍යවරු ඉඩ දුන්නෙත් නැහැ. මේ වෙද්දී මගෙ සැමියාගෙ නංගි (සුනේත්‍රා) ටත් පොඩි දරුවෙක් හිටියා. මම ලොකු පුතා එක්ක රෝහලේ ඉන්න කාලේ පොඩි පුතා හැදුනේ එයාගෙ නැන්දගෙ කිරි බීලා. ඒ නංගි තමයි පොඩි පුතාට නිරෝෂන් කියල නම දාන්නත් යෝජනා කළේ..."

නිරෝෂන් චූටි කාලේ හරිම දඟ බබෙක්ලු. දුවන්න, පනින්න, ගස් නගින්න, ගිහින් වැටිලා තුවාල කරගත්තු අවස්ථා, අම්මගෙන් දඬුවම් ලැබූ අවස්ථා තියෙනවලු. එක දවසක් අවුරුදු උත්සවයක් නරඹලා ඇවිත් නිරෝෂන්ගෙ අයියයි නිරෝෂනුයි දෙන්නා අට්ටාලයක් හදාගෙන කොට්ටපොර තරගයක් පවත්වලා. ඒ වෙද්දී නිරෝෂන්ට වයස අවුරුදු හතරක් විතර ඇති. අයියට අවුරුදු හයකට ආසන්නයි. මේ පුංචි කොට්ටපොර තරගකරුවන්ගේ සංග්‍රාමය දුරදිග ගිහින් නිරෝෂන්ගේ අතක් බිඳිලා මාස ගණනක් ප්‍රතිකාර කරන්නත් සිදුවුණාලු.

පුංචි දරුවන්ට ඉඳුල් කටගෑම නැකතකට උත්සවාකාරයෙන් සිදුකරන එක අපේ සංස්කෘතියේ අංගයක්. නිරෝෂන්ටත් ඉඳුල් කටගෑමේ උත්සවය පවත්වන්න දෙමාපියෝ සූදානම් වෙලා.

"අපි ඉඳුල් කටගාන්න සූදානම් වන අතරේ පොඩි පුතා දණ ගාගෙන ගිහින් ගෙදර ඇති කරන පූසට දාල තිබුණු පිඟානෙන් බත් අහුරක් අරගෙන කෑවා. ඔය සිද්ධිය කියලා කට්ටිය පස්සෙ කාලෙදී පොඩි පුතාට විහිළු කළා..."

නිරෝෂන්ගේ මව අතීත සිදුවීමක් මතක් කරල මහ හයියෙන් හිනාවුණා.

නිරෝෂන් දරුවා හරිම සංවේදී දරුවෙක්ලු. ඒ හින්දම සුළු සිදුවීම් ගැනත් දිගින් දිගට හිතන එක, ටිකක් කේන්ති යන එක ඔහුගේ සිරිතක්ලු. ඒ නිසාම සිදුවූ සිදුවීමක් නිරෝෂන්ගේ මව සිහිපත් කළා. මේ සිදුවීම වෙලා තියෙන්නේ නිරෝෂන්ට වයස අවුරුදු 4 දී විතර.

"ඔය දවස්වල අපේ ගෙදර පරෙවියෙක් ඇති කළා. පූසා ඔය පරවියාව මරලා කෑවා. ඒ සිද්ධියෙන් පොඩි පුතා හරියට කම්පා වුණා. එදා රෑ නිදා ගන්න ගිහිල්ලත් කියන්නෙම ඒක ගැන. පසුවදා උදේ නැගිටලා පොල්ලකුත් අරගෙන ගිහින් පූසාගෙ පිට කොන්දට ගහනකම් අපි දන්නෙත් නැහැ. ඒ පාරට පූසගෙ කොන්ද කැඩුණා. ඌ මියයනතුරුම කකුල් දෙක ඇද ඇද තමයි ඇවිද්දේ. හිතේ ආවේගයට ගැහුවට පූසා විඳින වේදනාව බලලා පොඩි පුතා හරියට කම්පා වුණා. ඊට පස්සෙ කවදාවත් එයා සතුන්ට පහර දුන්නෙ නැහැ. ඒ තරමට අර සිද්ධිය පොඩි පුතාගේ හිතට බලපෑවා...."

පුංචි ළමයින්ගෙ ඇහැ ඇදිල යන්නේ තද වර්ණවලට. නිරෝෂන්ටත් පුංචි කාලේ මේ පුරුද්ද තිබුණලු. නිරෝෂන්ගෙ තාත්තා අයියටයි මල්ලිටයි ඇඳුම් අරගෙන ආවම එතැන තියෙන ඇඳුම් අතරින් තදබල වර්ණ තියෙන ඇඳුම් ටික ගන්න එක තමයි නිරෝෂන්ගේ සිරිත. තද පාට සහිත ලස්සන ලස්සන කමිස පොඩියි, කලිසම් පොඩියි අඳින්න නිරෝෂන් චූටි කාලෙදී ලොකු ආශාවක් දැක්වුවාලු.

■ ආරියවංශ කුලතිලක



"දවසක් පාන්දරක මම ඇස් දෙකෙන්ම දැක්කා ඩොක්ටර් මගෙ මැරිච්ච ආච්චි අපේ ගේ ඉස්සරහ ජනේලෙ ළඟට වෙලා ගේ දිහා බලන් ඉන්නවා. එදා රස්සෙ වැඩිකමට අපි ජනේල ඇරල සාලෙ නිදාගත්තෙ."

# මියගිය අත්තම්මා පවුලක් සුනු විසුණු කරන්නට ඇත සිට ජනේලය දෙස බලා සිටියි



මානසික රෝග විශේෂඥ වෛද්‍ය
**රූමි රූබන්ගේ**
වෘත්තීය අත්දැකීමක් ඇසුරෙනි

අනුර සහ ලලනි මැදිවියේ යුවළක්. ඉතා දුක් මහන්සි වී තම ව්‍යාපාරය ගොඩනගා ගත් අනුර මේ වන විට යම් සාර්ථකත්වයකට පැමිණ තිබුණා.

නමුත් මෑතක සිට ඔවුහු විශාල ගැටලුවකට මුහුණපා සිටියා. අනුරට දියවැඩියාව සහ අධික රුධිර පීඩනයෙන් පෙළුණා. ඊට ප්‍රතිකාර ගන්නා අතරේ ඔහුට ටික කලක සිට තදබල කැම අරුචියක් ඇතුළු විවිධාකාර කායික රෝගාබාධ ඇති වුණා. කොතෙක් ප්‍රතිකාර කළත් එය සුවපත් වූයේ නැත.

කෙසේ හෝ එක් කායික රෝග වෛද්‍යවරයකු අනුරව මානසික රෝග සායනය වෙත යොමුකර තිබුණේ මේ අතරතුරදීය.

අනුර සමග ලලනිද මානසික රෝග විශේෂඥ වෛද්‍යවරයා වෙත පැමිණියා. "කිසිම බෙහෙතකින් මෙයාගෙ ලෙඩේ නම් හොඳ වෙන පාටක් නෑ ඩොක්ටර්. මෙයාගෙ ආච්චිගෙ වැඩේම අපෙ ගේ දිහාම බලා ඉන්න එක. මේ සේරටම මුල ඒක තමයි"

සැමියා රෝග විස්තරය වෛද්‍යවරයා වෙත දන්වා සිටීමෙන් පසු බිරිඳ ඊට අතුරු කතාවක් එකතු කළා.

"ආච්චිගේ ගේත් මියගොල්ලන්ගෙ ගේ ගාවද තියෙන්නේ?" මනෝ වෛද්‍යවරයා ඇසුවා.

"එයා හිටියෙ අපේ ගෙදරමයි. දැන් එයා නැතිවෙලත් අවුරුදු කීපයක් වෙනවා" ඇගට පතට නොදැනී වාගේ ලේලි පිළිතුරු දුන්නා.

අනුර පැවැසූ ආකාරයට ඔහු කුඩා වියේ පටන් හැදී වැඩී තිබුණේ මෙම මිත්තණිය සමගයි. එයට හේතුව ඔහුගේ මවුපියන් දෙදෙනා එම විවාහයෙන් වෙන්ව වෙනත් විවාහයක් කරගෙන තිබීමයි. අනුරව හදා වඩා ගනිමින් ඔහුට උගන්වා විවාහයක්ද කරදීමෙන් වසර ගණනකට පසු මිත්තණිය මියගියා.

"දවසක් පාන්දරක මම ඇස් දෙකෙන්ම දැක්කා ඩොක්ටර් මගෙ මැරිච්ච ආච්චි අපේ ගේ ඉස්සරහ ජනේලෙ ළඟට වෙලා ගේ දිහා බලන් ඉන්නවා. එදා රස්සෙ වැඩිකමට අපි ජනේල ඇරල සාලෙ නිදා ගත්තෙ. ඊට පස්සෙ මට කීප දවසක්ම ඇහුණා ආච්චි රෑට කෙඳිරි ගාන සද්දෙ. දැන් වරින්වරම මම එයාව ගේ වටේ ඉන්නවා දකිනවා" අනුර විස්තර කළා.

ඔවුන් පවසන පරිදි මිත්තණියගේ බැල්ම වැටෙන්නට පටන් ගත් පසු අනුර විවිධාකාර ලෙඩ රෝගවලින්ද පෙළෙන්නට පටන්ගෙන තිබුණා. මෙතෙක් අසීරුවෙන් උපයා සපයාගෙන තිබූ මුදල් වැඩි කොටසක් වියදම් වී තිබුණේ එම ලෙඩ රෝගවලට ප්‍රතිකාර ගැනීමට සහ මිත්තණියගේ බැල්ම පලවාහරින්නට බලිතොවිල් ශාන්තිකර්ම කරන්නටයි. නමුත් කිසිදු ප්‍රතිඵලයක් ලැබුණේ නැහැ. ආච්චිගේ බැල්ම වැටීම සේම අනුරගේ ලෙඩ තවමත් එහෙමමයි.

මනෝ වෛද්‍යවරයාට දැන් තවත් අතුරු ප්‍රශ්නයක් නැඟී තිබුණා.

"ඔයා මත්පැන් එහෙම ගන්නවද?" වෛද්‍යවරයා තම ප්‍රශ්නය අනුරට ඉදිරිපත් කළා.

"ටිකක් ගන්නවා" අනුර මඳ පැකිලීමකින් පැවැසුවා.

"ටිකක් කිව්වෙ?" වෛද්‍යවරයා නැවත ඇසුවා.

"නෑ ඉතින් මං බිස්නස්නෙ කරන්නෙ ඩොක්ටර්. දවල්ට සමහර වෙලාවට වැඩිය වැඩක් නෑ. ඒ වෙලාවට ඉතින් කම්මැලිකම යන්න ගෙදර බෝතලයක් තියාගෙන ටික ටික ගන්නවා. ඒත් වෙරිවෙලා උන්හිටි තැන් අමතක වෙන තරම් තත්ත්වෙකට නම් ඇවිත් නෑ" අනුර එසේ පැවැසුවා. දිගින් දිගටම මනෝ වෛද්‍යවරයා නැඟූ ප්‍රශ්නවලට අනුර දුන් පිළිතුර අනුව හැඟී ගියේ ඔහු ඇතැම් දිනවලට උදේ සිට රෑ වනතුරු බොන මත්පැන් ප්‍රමාණය බෝතල් එකහමාරක් පමණ වන බවයි.

මේ අතර බිරිඳ කී තවත් කරුණකින් අනුරගේ රෝගී තත්ත්වය තහවුරු කර ගත හැකි හේතුවක් තවදුරටත් හෙළි වුණා.

ඇය කීවේ මිත්තණිය සිය සැමියාව බිලි ගන්නට හදන බවය.

"මෙයාට කසාදයක් කරල දුන්නට මොකද ඔය මනුස්සයට ඕන වුණේ මාවයි මෙයාවයි වෙන් කරන්නමයි."

එම බිරිඳ අප්‍රසාදයෙන් යුතුව කීවා. වෛද්‍යවරයාට එය තවත් අලුත් තොරතුරක් වුණා.

"කොහොමද කියන්නෙ මැරිච්ච ආච්චි දැන් දෙන්නව වෙන් කරන්න හදනව කියල"

"මං මෙච්චර කාලෙකට කිසිම වැරදි වැඩක් කරපු කෙනෙක් නොවේ ඩොක්ටර්. ඒත් මෙයාට දැන් හැම තිස්සෙම මාව සැකයි. මං පිරිමියෙක් එක්ක කතා කළත් මෙයා මාව අනිවාර්යෙන් සැක කරනවා. හැම තිස්සෙම දැන් අපි අතරෙ රණ්ඩු" ලලනි කියාගෙන ගියා. විශේෂඥ මනෝ වෛද්‍යවරයාට දැන් සියල්ල පැහැදිලිය.

ඔවුන් විසින් පැවැසූ කරුණුවලට අනුව දිගු කලක් තිස්සේ මත්පැන් ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඔහුට විවිධ මානසික රෝග ලක්ෂණ පහළ වී තිබෙනවා. මියගිය මිත්තණිය දකින්නට ලැබීම යනු සැබෑවටම දැකීමක් නොව මත්පැන් දිගුකලක් ගැනීම නිසා හටගත් මනෝ භ්‍රාන්තියක්. (Hallucination) මෙය මායාවක් ලෙස නොව සැබෑවක් ලෙස සිතූ ඔහු මෙන්ම බිරිඳත් තීරණය කළේ මිත්තණිය තම නිවසට බැල්ම දාගෙන හිඳීමක් ලෙසයි. ඒ නිසා ඇති වූ බිය මතින් ඔහු දිවා කාලයට තවදුරටත් මත්පැන් ගැනීමට පටන් ගත්තා. මත්පැන් ගැනීම වැඩි වෙනවාත් සමගම මනෝ භ්‍රාන්ති පෙනීමද වැඩි වුණා. මේ අතර ඔහුට මිත්තණිය කෙඳිරිලි හඬක් නගන අයුරුද ඇසෙන්නට වී තිබුණා. එය ශ්‍රව්‍ය භ්‍රාන්තියකි. මෙයද මත්පැන් වැඩි වැඩියෙන් ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවූවක්.

මේ අතර ඔහු කවදාවත් නැති අයුරින් නිරපරාදේ බිරිඳව සැක කරන්නට පටන් ගත්තේ එය ලිංගික ඊර්ෂ්‍යාව (Pathological jealousy) නම් මානසික ආබාධය නිසයි. මත්පැන් දිගු කලක් තිස්සේ ගන්නා අයට වැළඳිය හැකි තවත් මානසික ආබාධයක් වන්නේ ලිංගික ඊර්ෂ්‍යාවයි. මේ අතර ඔහුට දියවැඩියාව සහ අධික රුධිර පීඩනය ද තිබීම නිසා තත්ත්වය තව නරක අතට හැරී කෑම අරුචිය ඇතුළු තවත් විවිධ කායික රෝග ලක්ෂණද පහළ වුණා.

ඒ අනුව බලි තොවිල් ශාන්තිකර්ම ආදියෙන් සුවයක් නොලැබුණු තැන ඔවුහු කායික වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු වුණා. නමුත් මේ මානසික ආබාධවලට මනෝ වෛද්‍ය ප්‍රතිකාර ලබාදිය යුතුයි. කායික වෛද්‍යවරයා විසින් ඔහු මනෝ වෛද්‍ය සායනයට යොමුකර තිබුණේ මේ තත්ත්වය අවබෝධකර ගෙනයි. ඉන්පසු මේ තැනැත්තා රෝහලේ වාට්ටුවේ නතර කරගෙන ඖෂධ සහ මනෝ චිකිත්සක ප්‍රතිකාරද ලබාදීමට සිදුවුණා.

■ ඉන්දු පෙරේරා

# ඔබ ඕනෑවට වඩා අනුන්ව විශ්වාස කරන කෙනෙක්ද?

## ඔබ ගැනම තේරුම් ගන්න ප්‍රශ්න 20ක්

කවුරුන් හෝ කෙනෙක් ඔබට කිව්වොත් මං මේ කියන්නේ සහතික ඇත්ත කියලා ඔබ ඒක ඉස් මුදුනින්ම පිළිගන්නවද? එහෙම නැත්නම් ඒ ගැන පිළිගන්නේ ටිකක් හොයල බලලද? ඇත්තෙන්ම මිනිස්සු කියන දේවල් ඒ ආකාරයෙන්ම පිළිගන්න එකත් ඒ හැටි ඇගට ගුණ දෙයක් නෙමෙයි. එහෙම කියලා මිනිස්සු දිහා අවිශ්වාසයෙන් බලන එකත් හොඳ නැහැ. ඇත්තෙන්ම ඔබ කොයිතරම් දුරට මිනිස්සු ගැන විශ්වාස කරන පුද්ගලයෙක්ද? පහත දැක්වෙන ප්‍රශ්නවලට ඔව් හෝ නැහැ යනුවෙන් පිළිතුරු දී ඒ ගැන ඔබම වටහා ගන්න.



1 ඔබ මිතුරෙකුට/ මිතුරියකට ණයට මුදලක් දුන් පසු ඒ ගැන නැවත මතක් කිරීමකින් තොරව ඔහු/ඇය ඒ මුදල නැවත ගෙවාවි යැයි ඔබ විශ්වාස කරනවාද?

2 බල්ලකු හපා කනවාට වඩා උගේ බිරිල්ල භයානක යැයි ඔබට සිතෙනවාද?

3 ඔබ ගමන් ගන්නා මෝටර් රථය රාත්‍රියක ආපදාවකට ලක්ව් මඟ නතර වූ අවස්ථාවක ඔබ පසුකොට යන තවත් මෝටර් රථයක් ඔබට උදව් වීම සඳහා නතර කරනවාද?

4 ඔබේ මුදල් පසුම්බිය මහ මඟ වැටුණු අවස්ථාවක එය අහුලාගත් පුද්ගලයකු ඔබව සොයා එය නැවත භාර දේවි යැයි විශ්වාස කරනවාද?

5 ඔබ නන්නාඳුනන පළාතක තනිව සිටින අවස්ථාවක යම් පුද්ගලයෙකුගෙන් යම් ස්ථානයක් පිළිබඳව විමසූ විට ඔහු නිවැරදි තොරතුරු දේවි යැයි විශ්වාස කරනවාද?

6 පුණ්‍යායතනයකට ඔබ විසින් පරිත්‍යාග කරන ලද මුදලක් ඔවුන් නිසි පරිදි පුණ්‍ය කටයුතු සඳහාම යොදවා ගනීවි යැයි විශ්වාසයක් ඔබට තියෙනවද?

7 වෛද්‍යවරයෙකු විසින් කරනු ලබන ප්‍රතිකාර පිළිබඳව අවංක විශ්වාසයක් ඔබට තියෙනවද?

8 සාප්පුවකින් බඩු මිලදී ගැනීමෙන් පසු ඉතිරි සල්ලි ගැන බැලීමේ පුරුද්දක් ඔබට තියෙනවාද?

9 යම් යම් ගනුදෙනුවලදී ලැබෙන වට්ටම් නියම අන්දමේ ලාබ නොවේ යැයි හැඟීමක් ඔබට තියෙනවද?

10 නක්ශත්‍රකරුවන් සහ සාස්තර කියන්නන් මිනිසුන්ට පවසන අනාවැකි පිළිබඳව විශ්වාසයක් ඔවුන් තුළත් ඇති බව ඔබ විශ්වාස කරනවාද?

11 ඔබ තැපැල් කිරීමට සූදානම් වන හදිසි ලිපියක් ඔබ වෙනුවෙන් තැපැල් කිරීමට යම් කෙනෙකු ඉදිරිපත් වූ විටෙක එසේ කිරීමට ඔහුට මතක් වේවි කියන විශ්වාසය ඔබට තියෙනවාද?

12 බොහෝ පුද්ගලයින්ට රූපවාහිනියෙන් ප්‍රදර්ශනය කෙරෙන වෙළෙඳ දැන්වීම්වල ඇත්ත නැත්ත පිළිබඳව ඇත්තේ සැකයක්. ඔබ මේ අදහසට එකඟ වෙනවාද?

13 ඔබේ මිතුරන් විනෝද ගමනක් ගොස් පැමිණීමෙන් අනතුරුව ඒ පිළිබඳව අතිශයෝක්තියෙන් වර්ණනා කිරීමට පෙළඹෙනවාද?

14 ඔබ ඔබේ බර මැන බලන අවස්ථාවල තරාදිය නියමාකාරයෙන් ක්‍රියාකරන බවට විශ්වාස කරනවාද?

15 ඔබ නිවසින් පිටතට යන අවස්ථාවල අසල්වැසියන් පිළිබඳ විශ්වාස කොට දොරේ යතුර යතුරු කටේම රඳවනවාද?

16 අවන්හලකින් කෑම කෑ පසු ලැබෙන බිල්පතේ සඳහන් ගණන් හිලව් නැවත එකතු කොට බැලීමේ පුරුද්දක් ඔබට තියෙනවාද?

17 සාමාන්‍යයෙන් බොහෝ පුද්ගලයින් තම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව කතා බහ කරද්දී අතින් දා කියන බව ඔබ විශ්වාස කරනවාද?

18 ලෝකයේ වැඩි දෙනෙක් අවංක යැයි සිතන මිනිසුන් මොළඳ යැයි ඔබට සිතෙනවාද?

19 කවුරුන් හෝ ඔබට සුබ පැතුවොත් එය අවංකවම කරන සුබ පැතුමක් යැයි ඔබ නිතර සිතනවාද?

20 ඉබාගාතේ යන පුද්ගලයකු ඔහුගේ දුක ඔබට පවසන අවස්ථාවල එම පුද්ගලයාට මුදලින් ආධාර කිරීමට ඔබ පෙළෙඹිනවාද?

## ලකුණු සටහන

1,2,3,4,5,6,7,10,11,14,15,19,20 යන ප්‍රශ්න සඳහා "ඔව්" යනුවෙන් දී ඇති පිළිතුරු සඳහා ලකුණු 5 බැගින්ද 8,9,12,13,16,17,18 යන ප්‍රශ්න සඳහා 'නැහැ' යනුවෙන් දී ඇති පිළිතුරු සඳහා ලකුණු 5 බැගින්ද ලබා දෙන්න.

**ලකුණු 70 ට වැඩි**

ඔබ හදවතින්ම මිනිසුන් විශ්වාස කරන ජාතියේ පුද්ගලයෙක්. ඒත් ඒ විශ්වාසය ඕනෑවට වඩා වැඩියි. තමන්ට කිසිම කෙනෙකුට කවදාවත් බොරුවක් නොකියන බවට ඔබ තරයේම විශ්වාස කරනවා. ඒත් මේ ලෝකෙ සමහර පුද්ගලයින් තමන්ගේ වාසි ප්‍රයෝජන සඳහා අන් අයට යොදා ගන්නා බව අමතක කරන්න එපා. ඒ නිසා ඔබේ විශ්වාසය ඉතා ප්‍රවේසමෙන් භාවිතා කරන්න මතක තියා ගන්න.

**ලකුණු 40-70 අතර**

අප බොහෝ දෙනෙක් වගේ ඔබත් මිනිස්සු සාමාන්‍යයෙන් අවංක යැයි සිතන කෙනෙක්. කොහොම වුණත් ඔබට මිනිසුන්ගේ විශ්වාසවන්තකම පිළිබඳව මූලික ඉවක් තියෙනවා. එය ජීවිතයට අත්‍යාවශ්‍ය දෙයක්. ඔබ මිනිසුන්ගෙ මූණ බලලා විශ්වාස කරන ජාතියේ පුද්ගලයෙක් නෙමෙයි. ඒ වගේම මිනිසුනව අවිශ්වාස කරන ස්වභාවයකුත් ඔබට නැහැ. හොඳින් හොයලා බලලා තමයි ඔබ මිනිසුන්ව විශ්වාස කරන්නෙ. මේ මට්ටම ඉතාම හොඳයි.

**ලකුණු 40 ට අඩු**

අඩු තරමින් කාලගුණ අනාවැකියක්වත් විශ්වාස කරන කෙනෙක් නෙමෙයි ඔබ. ඇත්තෙන්ම ජීවිතයේ සමහර දේවල් සමහර පුද්ගලයින් විශ්වාස කළ හැකි බවට ඔබ සිතන්නේ නැත්තේ ඇයි? මේ ලෝකය කියන්නේ ඔබටම වංචා කිරීමට සැදුණු පුද්ගලයින් ඉන්න තැනක් කියලා විශ්වාස කරන්න එපා. එය ඔබේ ජීවිතයට වගේම සමාජයීය සම්බන්ධකම්වලටත් අයහපත් ලෙස බලපාන්නක්.

■ ශිරෝනි ශ්‍රෙරෝ



අද මුද්දරවලට, ලියුම් කවරවලට වැඩක් ඇත්තෙම නැති තරමට විද්‍යුත් තැපෑල ඉතා ජනප්‍රියවෙලා. මේ විද්‍යුත් තැපෑල හරහා හුවමාරු කරගන්නා තොරතුරු අතරෙම් විට ඉතා රසවත්, ප්‍රයෝජනවත්, හාස්‍යජනක ඒවායි. ඉතින් එවැනි පණිවුඩ විද්‍යුත් තැපෑල භාවිතා කිරීමේ පහසුකම් නැති අය එක්කත් බෙදා හදාගන්න අපි හිතුවා. ඒ හින්දයි අද සිට මේ ridma@lakbima.lk ඊ-මේල් ලිපිනය විවෘත වුණේ. ඔබ අසා ඇති ඔබට යොමු වූ රසවත්, හරවත් දෑ මේ ඊ-මේල් ලිපිනයට යොමු කරන්න. එහෙම නැතිනම් එය පහත සඳහන් ලිපිනයට සාමාන්‍ය තැපෑලෙන් එවන්න.

ridma@ lakbima.lk

445/1, සිරිමාවෝ බණ්ඩාරනායක

මාවත, කොළඹ 14.

**ridma@lakbima.lk**

## රෝද ඉබ්බා...



■ දිමුතු සෙල්ලපෙරුම

## සාර්ථක ජීවිතයකට

- ඔබේ අනාගතය කුමක් වේදැයි බියට පත් නොවන්න. බිය වුණොත් ලැබෙන්නේ බිය වූ දේමය. සරු සාර හොඳ ජීවිතයක් ගත කළහැකි බවට විශ්වාසයක් ඇති කරගෙන උත්සාහවන්ත ලෙස වැඩ කරමින් ඉදිරියටම යන්න. ඔබේ අනාගත අපේක්ෂා ඉටු වනු නියතයි.
- ඔබට විසඳිය නොහැකි බරපතළ ප්‍රශ්නයක් ඇති වුණොත් ඒ ගැන සැමටම නොකියන්න. ඉතා විශ්වාසවන්ත එක මිතුරකු සිටී නම් ඔහුට කියන්න. එයද කළ නොහැකි නම් සන්සුන් සිතකින් යුතුව ඔබේ ප්‍රශ්නය ගැන එකින් එක කරුණු මෙනෙහි කරන්න. විසඳුම ඔබට ලැබෙනු ඇත.
- ලොව විශිෂ්ට පුද්ගලයන්ගේ චරිතාපදාන කියවීම පුරුද්දක් කරගන්න. පරාජය ජයග්‍රහණයක් බවට පත් කරගෙන උත්සාහවන්තව නැගී සිටිමින් ඔවුන් ජීවිතය ජය ගත්තේ කවරාකාරයෙන් දැයි ඒ කතාවල සඳහන් වේ.
- ජීවිතය යනු මේ ගත කරන මොහොතයි. එය යහපත් වන්නේ තම සිතුම් පැතුම් යහපත් වුණොත් පමණි.
- ආදරය යනු ඉඳුරන් පිනවීම නොවේ. ඒ නිසා ඉඳුරන්ට වහල් වී ජීවිතය ප්‍රපාතයට ඇද නොදමන්න. අවසාන් ආදරය ආශ්වාදයෙන් තොරය.
- ඔබට හැකි ආකාරයට අනයයන් වෙනුවෙන් පරිත්‍යාගශීලී වන්න. ඔබ එසේ වනවිට ඔබට අන් අයගේ පරිත්‍යාග ඊට වඩා ලැබෙනු ඇත. අන් අයගේ සහයෝගයෙන් ආශිර්වාදයෙන්, තොරව නැගී සිටීම අතිශයින්ම දුෂ්කරයි.

■ ජයසේකර මලවිආරච්චි

## දූවියට ඔවදනක්...

හැකියාවක් තිබේ නම් කෙසේ හෝ විවාහ වන්න. ඔබට යහපත් බිරිඳක් ලැබුණ හොත් ඔබ වාසනාවන්තයෙකු වනු ඇත. වදක භාර්යාවක් ලැබුණහොත් දර්ශනවාදියෙකු වනු ඇත.

දැකුම්කළු තරුණයන් සොබා දහමේ අත්වැරදීම්ය. දැකුම්කළු මහල්ලන් කලා කෘතීන්ය.

අප වචනයෙන් හෝ දිවෙන් ප්‍රේම නොකළ යුතුය.

ක්‍රියාවෙන් හා සත්‍යයෙන් ප්‍රේමකළ යුතුය

හොඳම දෙමව්පියන් නම් පියා, සැඩපරුෂකම යටින් මෘදු බව තබාගත යුතුය. මව මෘදු බවට යටින් සැඩපරුෂකම තබා ගත යුතුය.

ඔබ ළඟ බුද්ධිය තිබේ නම් අන් අය ඉන් ඉටිපහන් දල්වා ගනී

ගෞරවනීය මිනිසෙකු බොරු ආඩම්බරය නොදනී

පුංචි සිත් සුළු දෙයින් පැහේ

බළලෙකු ඉතා තියුණු ලෙස මීයෙකු දෙස බලා සිටින්නා සේ මරණය අප සැම දෙනා දෙසම බලා සිටී

■ චන්දිමා විජේතුංග

## සබඳ ඔබේ සිත නිබඳ සොඳුරු වේවා

**අවංක වන්න** -
පමා වී හෝ ඔබට සාධාරණය ඉටු වේවි

**නිහතමානී වන්න** -
මිනිසුන් ඔබ අගය කරාවි

**ගුණගරුක වන්න** -
මිනිසුන් ඔබට ගෞරව කරාවි

**සුබවාදීව සිතන්න** -
දුකෙනි වන සතුටද විඳගන්න ඔබට ලැබේවි

**ආදරණීය වන්න** -
සදාකාලයෙන් සදාකාලයට ඔබ තනි නොවේවි

■ විරාජ් දුෂ්මන්ත ප්‍රනාන්දු

### මුදල් ඇති විට

ඔබට ඔබ අමතකයි
ලෝකයාට ඔබ මතකයි

### මුදල් නැති විට

ඔබට ඔබ මතකයි
ලෝකයාට ඔබ අමතකයි

■ ශානක නානායක්කාර

## යෝග..



■ විරාජ් ප්‍රියදර්ශන



# යුග දිවියේ හැම හීනයක්ම ඉටු වූ පසුව ජීවිතය විඳවන්නට වූ ගැහැණියක්

උපේක්ෂා ඩිලාන් සමඟ විවාහ වුණේ දෙමාපිය කැමැත්තට පිටුපාන්න ශක්තියක් නොවුණු නිසයි. ව්‍යාපාරිකයකු වුණු ඩිලාන්ගෙ පියාත්, උපේක්ෂාගෙ පියාත් පාසල් යන කාලෙ ඉඳන්ම ගජ යාළුවො. ඒ යාළුකම නෑදෑකමක් බවට පත් කර ගන්න දෙන්නටම තිබුණු වුවමනාව නිසයි තමන්ගෙ දරුවන් දෙන්නව විවාහ කළේ.

ඩිලාන්ව පුංචි කාලෙ ඉඳන්ම හඳුනාගෙන හිටියත්, ඇසුරු කළත් උපේක්ෂාගේ සිතේ නම් කිසිම දවසක ඩිලාන් ගැන ආදරයක් ඇතිවෙලා තිබුණෙ නෑ. ඒත් ඩිලාන් නම් තමාට කැමැත්තෙන් සිටි බව උපේක්ෂාට නොයෙක් වර හැඟී ගිහින් තිබුණා. උපේක්ෂා ඔහුගෙ ඒ අදහසට යන්නමටවත් රුකුලක් දුන්නෙ නෑ. ඩිලාන්ට අකමැති වෙන්න කිසිදු හේතුවක් නොතිබුණත් කවදාවත් උපේක්ෂාගෙ හිත ඩිලාන් ළඟ රැඳුනෙ නෑ. ඒකට හේතුව මොකක්ද කියලා උපේක්ෂාවත් දැනගෙන හිටියෙ නෑ.

ඩිලාන් ඒ පවුලට හිටපු එකම පුතා. පියාගේ ව්‍යාපාර සියල්ල ඔහුට තමයි පැවරී තිබුණෙ. ඒ ව්‍යාපාර පියාටත් වඩා හොඳින් දියුණු කරගන්න ඩිලාන් සමත් වී තිබුණා. උසස් අධ්‍යාපනය සඳහා ඔහු හැදෑරුවෙත් ව්‍යාපාර කළමනාකරණයයි. ඒ හැරුණු විට අලෙවිකරණය සම්බන්ධ උසස් විභාගත් ඔහු සමත් වී තිබුණා.

මේ මොන අතකින් හොඳ වුණත් උපේක්ෂාට ඩිලාන් ගැන ලොකු සතුටක් හෝ ලොකු ආඩම්බරයක් දැනුණෙ නෑ.

ඒකට ලොකුම හේතුවක් වුණේ ඔහු ව්‍යාපාර සම්බන්ධයෙන් දැක්වූ අධික උනන්දුව විවාහ ජීවිතය සම්බන්ධයෙන් නොදැක්වීමයි. උපේක්ෂා එක්ක ගමනක් බිමනක් යන්න තියා නිදහසේ පැය කිහිපයක් ගෙදර රැඳී ඉඳින්නවත් ඩිලාන්ට වෙලාවක් තිබුණෙ නෑ. මහ රෑ යාමේ නින්දට වැටෙන ඩිලාන් උදේ අට විතර වෙනතුරු සුව නින්දක් නිදා ගන්නා. ඊට පස්සෙ නාලා කාලා බීලා ගියේ ව්‍යාපාරික ස්ථානයට. මේ හේතු නිසා උපේක්ෂාට දැනුනේ තමන්ගෙ ජීවිතේ විශාල හිස් බවක් වගේම හිඩැසක් තියනවා කියලයි. නමුත් ඒ කිසිවක් ඩිලාන් අවබෝධ කරගෙන නොතිබුණු බව තමයි පෙනුණෙ. ඔහු කළ එකම දේ උපේක්ෂාට අවශ්‍ය වෙලාවට ඇති තරම් මුදල් දෙන එක විතරයි. එයින් තමන්ගෙ යුතුකම් සියල්ල ඉෂ්ට වුණු බවත් ඩිලාන් සිතා ඉන්න ඇති.

ඩිලාන් සමඟ විවාහ වෙලා වසරකුත් පසු වුණත් උපේක්ෂාට දරු සම්පතක ලකුණක් වත් පිහිටියෙම නෑ. ඇගේ ජීවිතයට නිරන්තරයෙන්ම දැනුණු පාළුව මකාගන්න දරුවෙක්වත් හිටිය නම් කියලා ඇය මහත් ආශාවෙන් බලාපොරොත්තු තියන් හිටියා. ඒත් එහෙම දෙයක් සඳහා වෛද්‍යවරයෙක් ළඟට යන්නවත් ඩිලාන්ට වෙලාවක් තිබුණෙ නෑ.

"එක දවසක් නම් ඔය කොහොම හරි වෙලාවක් වෙන් කරගෙන යන්න බැරියැ. ඒත් ඔවට දවස් ගණන් දොස්තරලා ළඟට බඩගාන්නයි, අර ටෙස්ට් මේ ටෙස්ට් කිය කියා සැරින් සැරේට කියන ටෙස්ට් වලට කාලෙ ගත කරන්නයි මට වෙලාවක් නෑ" කියල තමයි ඩිලාන් මේ ප්‍රශ්නෙදි හැම දාමත් දුන්නු පිළිතුර වුණේ.

මොන තරම් සල්ලි සැප සම්පත් තිබුණා වුණත් මේ ගත කරන ජීවිතේ මොකක්ද කියලා උපේක්ෂාට නිතර නිතරම හිතෙන්න පටන් ගත්තා. අන්තිමේ උපේක්ෂා හිතුවා ටික දවසකට මහගෙදර ගිහින් නතර වෙනවා කියලා. ඒක තමන්ට පහසුවක් කියලා හිතුණු නිසාදෝ උපේක්ෂගෙ ඒ ඉල්ලීමට ඩිලාන් එක හිතින් කැමැත්ත දුන්නා. මේ ගමන දෛවෝපගත සිදුවීම් රැසක ආරම්භය කියලා උපේක්ෂාට මොහොතකටවත් හිතුණෙ නෑ.

ඉස්කෝලෙ යන කාලෙ උපේක්ෂාගෙම පන්තියෙ ඉගෙන ගත්තු දුමින්ද ඒ දිනවල උපේක්ෂාගෙ ආදරය පැතුවා. ඒත් උපේක්ෂා ඒකට එකඟ නොවුණෙ දෙමාපියන්ගෙ කීමට ඉහළින් යන්න කැමැත්තක් නොතිබුණු නිසයි. මහ ගෙදර ටික දවසකට නතර වෙන්න ගිය උපේක්ෂාට අහම්බෙන් එක දවසකදී දුමින්ද මුණ ගැහුණා. දුමින්ද ළඟදීම විවාහ වෙන්න යන බව කිව්වම කවදාවත් නොවුණ විදිහට උපේක්ෂාගෙ හිත සසල වුණා. ඒකට හේතුවක් උපේක්ෂාට හිතා ගන්න බැරි වුණා. ඒත් දුමින්දට උපේක්ෂාගෙ වෙනස තේරෙන්න ඇති. ඒ නිසාම උපේක්ෂාගෙ තොරතුරු දැඩි වුවමනාවකින් විමසන කොට ඉබේම වගේ උපේක්ෂාට තමන්ගෙ අතෘප්තිකර විවාහ ජීවිතය ගැන කියවුණා. සේරම කතාව අහගෙන හිටපු දුමින්ද 'දැන් ඉතින් මට ඔයාව බාර ගන්න විදිහක් නැහැනේ. වෙඩින් එකට දිනත් නියම කරගෙන තියෙන්නේ. එහෙම නොවුණ නම් මං ඔයාව ඩිලාන්ගෙන් දික්කසාද කරවලා කසාද බඳිනව උපේක්ෂා' කියලා දුමින්ද කිව්වම උපේක්ෂාගෙ ඇස්වල කඳුළු පිරුණා.

කොහොම වුණත් ඒ හමුවීමෙන් පස්සෙ ඔවුන් අතරේ අතියම් සම්බන්ධකමක් ගොඩනැඟුණෙ ඉබේමයි. මේ අතරේ එක්තරා දවසක දුමින්දත් උපේක්ෂාත් කායිකව එකතු වුණා. ඊට පස්සෙ උපේක්ෂාට ඇතිවුණේ ලොකු බයක් වගේම තමන් මහ නරක ගැනියක් කියන වරදකාරී හැඟීමයි. තමන් ගැනම ඇතිවුණු විශාල කළකිරීම මත පහුවදාම උපේක්ෂා ඩිලාන්ගෙ ගෙදරට ගියේ නැවත කවදාවත් දුමින්ද හමුවෙන්නෙවත් දුරකථනයෙන් කතා කරන්නෙවත් නෑ කියන අධිෂ්ඨානයෙන් . ඩිලාන් මොන විදිහෙ ගති පැවතුම් තියන කෙනෙක් වුවත් ඔහු තමාට වරදක් කරල නැති නිසා ඔහු සමග අලුත් ජීවිතේකට මුල පුරනවා කියල උපේක්ෂා හිතා ගත්තා.

හරියටම ඊළඟ මාසය වෙද්දී තමාගේ ශරීරයේ අමුත්තක් උපේක්ෂාට දැණුනා. තමා ගැබ්ගෙන ඇති කියන සැකයක් එක්ක ලොකු බයක් උපේක්ෂාට දැනුණා. මුත්‍රා පරීක්ෂණයකින් ඒ බව තහවුරු වුණාට පස්සෙ උපේක්ෂාට දැනුණෙ විශාල චකිතයක්. මේ දරුවගෙ පියා දුමින්ද විය හැකියි කියලා උපේක්ෂාගේ හිත කිව්වා. මේ කිසිවක් දැන නොසිටි ඩිලාන් බොරුවටනේ ඩොක්ටර්ස්ලා හම්බ වෙන්න යන්න හැදුවෙ. නිසි කාලෙ ආවම හැමදේම සිද්ධ වෙනව කියමින් උදම් ඇනුවා. ඒත් ඒ වෙලාවට උපේක්ෂාට දැනුණෙ. තමන් මැරි මැරී උපදිනව වගේ හැඟීමක්. මව් පදවිය ලබන්න පෙරුම් පුරා බලා සිටි උපේක්ෂාට දැන් තමන්ගේ කුස දකින දකින ගානෙ දැනෙන්නෙ මහ ලොකු බයක් වගේම විශාල කළකිරීමක්. ඒත් ඒ රහස ලෝකෙන්ම වසන් කරගෙන තනියම විඳවන්නට උපේක්ෂාට සිදුවෙලා තියෙනවා.



■ ඉන්දු පෙරේරා



## මගේ දුව මට බේරා දෙන්න

# ආදරණීය තාත්තා කෙනෙකුගේ සංවේදී ඉල්ලීමක්

දරුවන්ගේ ලෙඩ රෝග ඉදිරියේ බොහෝ විට අඬන්නේ දොඩන්නේ අම්මලා. ඒ අම්මලාට කඳුළු පිට කරන්නේ නැතිව ඒ වේදනාව දරා ගන්න බැරි හින්දා.

හැබැයි තාත්තලා එහෙම නෙමෙයි. තාත්තලා ඒ දුක දරාගෙන හදවතින් අඬනවා. ඒ හින්දා ඒ අය දුක්වෙන බව හැමෝටම පෙනෙන්නෙ නැහැ. දැනෙන්නේ නැහැ.

අපට එහෙම හිතුණේ තමන්ගේ දියණිය වෙනුවෙන් වේදනා විඳින තාත්තා කෙනෙක් මුණගැහුණු වෙලාවකයි.

මේ තාත්තගේ නම ආරියපාල. ඔහු පදිංචිව සිටින්නේ දකුණේ දෙවිනුවර ප්‍රදේශයේ.

දැනට සුළු රැකියාවක් කරමින් මාසික වැටුපක් ලබන ආරියපාලට තමන්ගේ දියණිය සුවපත් කර ගැනීමට අවශ්‍ය රුපියල් ලක්ෂ 25 සොයා ගැනීමට නොහැකිව අසරණ වෙලා.

"ලක්ෂ 25ක් සොයා ගන්න වෙනවා කියලා දැනගත්තහම අපි පත්වුණු තත්ත්වය වචනයෙන් කියන්න බැහැ. අපි වගේ අඩු ආදායම් ලබන අය මේ වගේ ලොකු මුදලක් සොයාගෙන දරුවව සනීප කර ගන්නේ කොහොමද කියලා හිතුවා.

ඒත් ඒ මුදල හිගා කාලා හරි සොයා ගන්න ඕන. අපේ දුව වෙනුවෙන් ඒක කරන්න ඕන මහත්තයා" ආරියපාල කඳුළු පිරි ඇසින් යුතුව කිව්වා.

ආරියපාලගේ දුව සිද්මි ධනංජනී. ඇය දැනට මාතර සුජාතා විද්‍යාලයේ ඉගෙනුම ලබනවා. වයස අවුරුදු 13යි.

"දුව ඉගෙනීමටත් හුගක් දක්ෂයි. එයාගේ ඉස්කෝලෙ හුගක් දක්ෂ ළමයි ඉන්නවා. ඒ අතර එයා ඉගෙනුමට දක්ෂ මුල් ළමයි පස් හය දෙනා අතර ඉන්නවා. මේ තරම් අමාරුවෙන් හිටියත් එයා පාසල් යනවා. ඉගෙනීමේ වැඩ කටයුතු ටික හොඳින් කරනවා."

දැන් ඔබ කල්පනා කරනවා ඇති සිද්මි දුව මුහුණපාලා ඉන්න රෝගී තත්ත්වය මොකක්ද කියලා.

ඔබ දන්න විදියට කියනවා නම් ඇය මුහුණ දී සිටින්නේ කොඳු ඇට පෙළ ඇදවීමේ රෝගයටයි. (Spine ScoLiSiS)

" මේ රෝගයට දුව මුහුණ දී සිටිනවා කියලා අපි දැන ගත්තේ මීට අවුරුදු තුනකට ඉස්සර. දවසක් දුවට උදරාබාධයක් හැදිලා වෛද්‍ය ප්‍රතිකාර ගන්න ගියා. ඒ වෙලාවේ තමයි දොස්තර මහත්තයා මේ සම්බන්ධව අපට කිව්වේ.

කොහොම හරි ඊට පස්සේ අපි මේ සම්බන්ධව ප්‍රතිකාර කරන විශේෂඥ වෛද්‍යවරු පවා හම්බ වුණා. ඊට පස්සේ ප්‍රතිකාරයක් හැටියට එයාගේ ශරීරය ඇද වෙන ස්ථානය තුළ හම්වලින් හැදූ තද ආවරණයක් පවා පාවිච්චි කරන ලෙස උපදෙස් ලැබුණා.

"ඒත් එයින් එයාට දැනුණෙ අපහසුවක් විතරයි. හැමදාම උදේට ඉස්කෝලෙ යද්දී අඬ අඬ ඒක ඇඳ ගන්නවා. ඒ අපහසුවෙන් ඉස්කෝලෙ ඇරෙන තුරුම ඉන්නවා. ඔය විදිහට අවුරුදු දෙක තුනක් එයා දුක් වින්දා.

මේ පුංචි දරුවා ඒ විඳින දුක අපට බලා ඉන්න පවා බැරි වුණා. ඒත් අපි මොනවා කරන්නද?"

කොහොම හරි මෑතකදී ඔවුන් මේ රෝගයට අදාළව ප්‍රතිකාර කරන තවත් දක්ෂ වෛද්‍යවරයකු හමුවුණා. ඔහු ලබා දුන්නේ මෙවැනි පිළිතුරක්.

"දරුවගේ කොඳු ඇට පෙළ ඇදවීම එන්න එන්නම වැඩි වෙනවා. දැන් බලා ඉන්න හොඳ නැහැ. එහෙම වුණොත් හුස්ම ගන්න බැරි විදිහේ තත්ත්වයක් වගේම ශරීරයේ අභ්‍යන්තර ඉන්ද්‍රියන්ට හානි වෙන්නත් පුළුවන්.

ඒ නිසා ඉක්මනින්ම ශල්‍යකර්මයකට යන්න. එහෙම නැති වුණොත් දරුවගේ ජීවිතේ අනතුරේ."

වෛද්‍යවරයා අදාළ තත්ත්වය පිළිබඳව කරුණු පැහැදිලි කළා.

මෙන්න මේ වෙලාවේ තමයි සිද්මිගේ තාත්තා ආරියපාල දරුවගේ ජීවිත අවදානම තේරුම් ගත්තේ.

ඊට පස්සේ මම ඉන්දියාවේ ඇපලෝ රෝහලට කතා කළා. ඒ සම්බන්ධව සියලු සම්බන්ධකම් හදා ගත්තා.

ඒ අනුව තමයි රුපියල් ලක්ෂ 25ක මුදලක් මේ වෙනුවෙන් සොයා ගැනීමට අවශ්‍ය වන බව අප දැන ගත්තේ.

දැන් අපි ලක්ෂ 8ක් පමණ සොයා ගෙන තිබෙනවා. ඒ අපි දන්න කියන අයගේ උදව්වෙන්. ඉතිරි මුදල සොයා ගන්න අමාරුයි. ඒ නිසා තමයි මහත්තයා මෙහෙම හරි පත්තරේක පළ කරලා සල්ලි හොයන්න හිතුවේ.

"මගේ දුවව ඉක්මනින් ඉන්දියාවට අරන් යන්න ඕන. එහෙම බැරි වුණොත් එයාගේ අහිංසක ජීවිතේ අනතුරේ."

ආරියපාල එහෙම කිව්වේ ඇස්වල තිබුණු කඳුළු අතරින්.





ඔවුන්ගේ ගිණුම් අංකය:
බී. ආරියපාල
8151011540
කොමර්ෂල් බැංකුව
මාතර
දුරකථනය : 0712217683
0412221008

■ සමන් ප්‍රියංකර නම්මුනිගේ



කළපුව අයිනේ සමර් ගෙට්ස්



ලොබිය



සම්භාෂණ උත්සව ශාලාව

# මඩකළපුවේ කළපු ඉවුරේ පිහිටි

## සුන්දර නිවාඩු නිකේතනයට යමු

නැගෙනහිර පළාතේ පාසිකුඩා සංචාරක ක්ෂේත්‍රයට නම්දරූ ප්‍රදේශයක් ඒ එම ප්‍රදේශයේ පිහිටි සුන්දර මුහුදු තීරය නිසා. පාසිකුඩා යන අයට ඒ මුහුදු තීරය ඇරුණහම අවට බලන්න ඒතරම් විශේෂ දෙයක් නැහැ. එතැනින් කිලෝමීටර් 35ක් පමණ ඈතින් පිහිටි මඩකළපුව ගැන සංචාරක ගමනාන්තයක් විදිහට බොහෝ දෙනාගේ කතා බහට ලක්වෙන්නේ නැහැ. ඒත් මඩකළපුව කියන්නේ සුන්දර මුහුදු තීරයකට වගේම කළපු තීරයකටත් හිමිකම් කියන බොහෝ දේ දැක බලාගන්න ඇති සංචාරය කරන්න අපූරු ප්‍රදේශයක්. මේ සතියේ අපි නිවාඩුවට යන්න කදිම තැන් ගැන කියන මේ පිටුවෙන් කියන්නේ මඩකළපුව ප්‍රදේශයේ පිහිටි සුන්දර නිවාඩු නිකේතනයක් ගැන තොරතුරු.

මඩකළපුව හන්දියේ ඉඳන් කල්මුණේ පැත්තට යද්දී හමුවන සුප්‍රකට කල්ලඩි පාලම පටන් ගන්න තැනින්ම වම් අත පැත්තට ඇති මුනිච් පාරේ මීටර් 850ක් පමණ එද්දී කළපුව මායිමේ පිහිටා ඇති මේ සුන්දර නිවාඩු නිකේතනය හඳුන්වන්නේ "හොටෙල් ඊස්ට් ලැගුන්" යන නමිනුයි.



සභාපති
මුත්තුකුමාර්
සෙල්වරාජ්

අක්කර 2ක පමණ භූමි භාගයක් පුරා පැතිර පවතින ඊස්ට් ලැගුන් නිවාඩු නිකේතනය මහල් 4කින් යුත් ගොඩනැගිලි 2කින් සමන්විතයි. එහි ඇති සම්පූර්ණ කාමර සංඛ්‍යාව 45ක්. මෙම කාමර වී.අයි.පී, සුපීරියර් කාමර, ඩිලක්ස්, ෆැමිලි, බිස්නස් හා හනිමූන් ආදී සුඛෝපභෝගී කාමර ලෙසත් නම් කොට තිබෙනවා.

මෙම සෑම කාමරයක්ම විශාල ප්‍රමාණයෙන් යුක්ත වන අතර ඒවා උණු සහ ඇල් වතුර සහිත යාබද නාන කාමර, වායුසමන, Wi-Fi, කේබල් රූපවාහිනී නාලිකා, තේ සහ කෝපි සාදා ගැනීමේ ආදී පහසුකම්වලින් යුක්තයි. ඒ වගේම මෙම හැම කාමරයක්ම පිහිටා ඇත්තේ කළපුවට මුහුණලායි. මෙහි ඇතැම් කාමර පුද්ගලික බැල්කනිද සහිත ඒවායි.

ඊස්ට් ලැගුන් හෝටලයේ දේශීය, විදේශීය ඕනෑම ආහාරයක් බුෆේ, අලාකාට්, සෙට් මෙනු හෝ බාබකිව් ආදී ඕනෑම ආකාරයකට පිරිනැමෙන අතර විශේෂයෙන්ම මඩකළපුව ප්‍රදේශයේ කෑම වර්ගවලටත් නම් දැරූ තැනක්. මෙහි පැමිණෙන ආගන්තුකයින්ට ආහාර ගැනීම සඳහා "ලැගුන් ලෝන්ජ්" සහ "ග්‍රෑන්ඩ් ලෝන්ජ්" නමින් අවන්හල් 2ක් තිබෙනවා. ඊට අමතරව සම්භාෂණ උත්සව ශාලාවක් සහ "මුතු" නමින් සමුළු ශාලාවක්ද මෙහි තිබෙනවා. සම්භාෂණ උත්සව ශාලාවේ 375 දෙනෙකු සඳහා ආගන්තුක සත්කාර සැලසිය හැකි, මංගල උත්සව, උපන්දින උත්සව ආදී ඕනෑම සාදයකට සුදුසු නවීනතම පහසුකම්වලින් යුක්තයි. මංගල උත්සව සඳහා මෙම ශාලාව වෙන් කරවා ගන්නා අයට කාමරයක්, පොල්තෙල් පහන, කෝලම් සැරසිලි, පුටු කවර, මේස සැරසිලි ආදිය නොමිලේම ලැබෙන අතර ඊට අමතරව එවැනි උත්සව සඳහා ඕනෑම පහසුකමක් නිවාඩු නිකේතනය හරහා සංවිධානය කරගත හැකියි.

නගරයට සමීපව පිහිටා ඇති නමුත් නිතරම කළපුව හරහා හමා එන සිසිල් සුළඟින් පිරී නිවන පරිසරයක් තමයි මෙහි ඇත්තේ. එසේම මෙහි පිහිටි පිහිනුම් තටාකයත් විඩා නිවන කදිම තැනක්. ඒ හැම දේටම වඩා වැදගත් මෙහි සුහදශීලී කාර්ය මණ්ඩලය.

"මඩකළපුව නගරයේ හොඳ පහසුකම් සහිත හෝටලයක් තිබුණේ නැහැ. ඒ අඩුව සපුරන්න තමයි මං 2013 අවුරුද්දේ ඊස්ට් ලැගුන් ආරම්භ කළේ. මේක සංචාරක මණ්ඩලය අනුමත කළ තරු හතර පහසුකම් තියෙන හෝටලයක්."

මේ පිළිබඳව අදහස් දක්වමින් මෙහි සභාපති මුත්තුකුමාර් සෙල්වරාජ් සඳහන් කළා.

මෙහි පැමිණෙන අයට ඒ අවට නැරඹිය හැකි තැන් බොහොමයි. කල්ලඩි පාලම, මඩකළපු ප්‍රදීපාගාරය, ඕලන්ද බලකොටුව, ගාන්ධි උද්‍යානය, කාමාචි අම්මාන් කෝවිල, පාසිකුඩා, තොප්පිගල ඒ අතරින් කිපයක්. ඒ වගේම බෝට්ටු සවාරි, මාළු බෑම, ආදී දේ වලත් යෙදෙන්න මෙහි පහසුකම් තිබෙනවා. මේ ගැන වැඩිදුර තොරතුරු ඔබට www.hoteleastlagoon.lk වෙබ් අඩවියට පිවිසීමෙන් දැනගත හැකියි.

ඡායාරූප - සිසිර හේමකුමාර

■ ගැමුණු රත්නායක



සුවපහසු කාමරයක්



සමුළු ශාලාව



පිහිනුම් තටාක



කළපුව හරහා ඊස්ට් ලැගුන් පෙනෙන

# MUPPETS MOST WANTED

# ලෝ ප්‍රකට Muppet චිත්‍රපට මාලාවේ අටවැන්න ආදායම් වාර්තා තබමින් ඉදිරියෙන්







වෝල්ට් ඩිස්නි සමාගම විසින් නිෂ්පාදිත අලුත්ම චිත්‍රපටය වන Muppet Most Wanted මේ දිනවල ලොව පුරා සිනමාහල්වල ප්‍රේක්ෂක ආකර්ෂණය මැද තිරගත වනවා. හොලිවුඩ් රසික රසිකාවියන් වඩාත් ජනප්‍රිය චිත්‍රපට මාලාවක් වූ Muppet චිත්‍රපට මාලාවේ අටවැනි චිත්‍රපටය වශයෙන් නිෂ්පාදිත Muppet Most Wanted අධ්‍යක්ෂණය කරනු ලැබුවේ James Robin විසින්.

පසුගිය සති අන්තයේ බොක්ස් ඔෆිස් වාර්තා අතර දෙවන ස්ථානයේ රැඳී තිබූ Muppet Most Wanted නිර්මාණය වූයේ 2011 වසරේ තිරගතවූ The Muppet චිත්‍රපටයේම දිගුවක් ලෙසයි. IMDb සිනමා දර්ශකයේ 10/7.2 අගයකට හිමිකම් කියන Muppet Most Wanted, Rotten Tomatoes හි 77%ක අගයක් ලබාගෙන තිබෙනවා.

බොහොම හාස්‍යජනක කතා තේමාවක් රැගත් මෙම සංගීතමය චිත්‍රපටය තිරගතවීම ආරම්භ වූයේ පසුගිය මාර්තු 11 වනදා. Muppet කණ්ඩායමේ කළමනාකරුගේ තීරණයකට අනුව ඔවුන් ලෝක සංචාරයක් සඳහා එක්වනවා. ඔවුන්ට මේ ලෝක සවාරිය අතරතුරදී මුහුණ දෙන්න සිදුවන අමුතු අමුතු සිදුවීම් පෙළක් තමයි Muppet Most Wanted චිත්‍රපටයේ ඇතුළත් වන්නේ. මේ ලෝක සවාරිය ඇත්තටම සවාරියක්ද, එහෙමත් නැතිනම් ඇබැද්දියක්ද?

ටෙලි චිත්‍රපට, පරිගණක ක්‍රීඩා වගේම රූපවාහිනී නාට්‍ය මාලා ආදියට පවා ප්‍රස්තුත වූ මෙම අපූරු රූකඩ කණ්ඩායම නිර්මාණය කරනු ලැබුවේ Jim Henson විසින්. ප්‍රථම වරට Muppet චිත්‍රපටයක් තිරගත වූයේ 1979 වසරේදී. The Muppet Movie නම් වූ එම චිත්‍රපටය අධ්‍යක්ෂණය කරනු ලැබුවේ James Frawley විසින්. ඉන් අනතුරුව 1981 වසරේදී The Great Muppet Caper නමින් දෙවන චිත්‍රපටය තිරගත වූ අතර තුන්වැන්න තිරගත වූයේ 1984 වසරේදී. 1992 වසරේදී වෝල්ට් ඩිස්නි සමාගම සිය පළමු චිත්‍රපටය 1996 වසරේදී හා 2011 වසරේදී තවත් චිත්‍රපට ද්විත්වයක් වෝල්ට් ඩිස්නි සමාගම විසින් නිර්මාණය කරනු ලැබුවා.

Rikey Gervais, Ty Burrell, Tina Fey මෙම සලරුවේ රංගනයෙන් දායකත්වය සපයනු ලබනවා. ඒ Dominic Badguy, Jean Pierre Napoleon සහ Nadya ලෙසයි. 2013 වසරේදී නිර්මාණ කටයුතු ඇරඹුණ චිත්‍රපටයේ පූර්ව ප්‍රචාරක පටයක් පළමු වරට ප්‍රේක්ෂකයින්ට දැකගත හැකි වූයේ 2013 වසරේ අගෝස්තු මාසයේදී. ඉන් අනතුරුව එකිනෙකට වෙනස් තවත් පූර්ව ප්‍රචාරක පට දෙකක් මෙම චිත්‍රපටය වෙනුවෙන් නිකුත් වූවා. මේ සියලු ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස Muppet Most Wanted හොලිවුඩ් ප්‍රේක්ෂකයින් අතර අසීමිත ජනප්‍රියත්වයක් හිමිකර ගත් සිනමා පටයක් බවට පත්වූවා.

■ ප්‍රියංකා ගන්කන්ද






සමාගත ලක්බිම නිව්ස් පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම කොළඹ 14 වේල්ලස්කුමාර මාවතේ අංක445/1හැන පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරණ ලදී